| | | |
|---|---|---|
| ආයතනය | - | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| අමාත්‍යාංශය | - | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| ලිපිනය | - | "නිපුණතා පියස",<br>නො: 354/2,<br>ඇල්විටිගල මාවත,<br>නාරාහේන්පිට,<br>කොළඹ 05 |
| ඊ මේල් ලිපිනය | - | info@vtasl.gov.lk |
| වෙබ් අඩවිය | - | www.vtasl.gov.lk |
| විගණකවරු | - | විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| බැංකුකරුවන් | - | මහජන බැංකුව<br>ලංකා බැංකුව<br>කොමර්ෂල් බැංකුව |

# පිළිගැන්වීම

ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
“ නිපුණතා පියස”
නො: 354/2
ඇල්විටිගල මාවත
නාරාහේන්පිට
කොළඹ 05

ගරු ඇමතිතුමනි,

**<u>වාර්ෂික වාර්තාව - 2015</u>**
**<u>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය</u>**

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) C වගන්තිය ප්‍රකාරව 2015 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට
විශ්වාසී

ඉංජිනේරු(ආචාර්ය) ලයනල් පින්ටු
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

# පටුන


1. දැක්ම සහ මෙහෙවර
2. කාර්යයන්
3. හැඳින්වීම
4. පාලක මණ්ඩලයේ වාර්තාව
5. 2016 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක
6. ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය
7. කාර්යය මණ්ඩල තොරතුරු
8. කාර්යය මණ්ඩලය පුහුණු කිරීම
9. වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
10. වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය
11. රැකියාගත කිරීම
12. රැකියා ස්ථාපනය
13. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සම්බන්ධිත වැඩසටහන්
14. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම
15. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
16. අභියෝග
17. මූල්‍ය වාර්තාව
18. මූල්‍ය ප්‍රකාශන පිළබඳ රජයේ විගණකාධිපති වාර්තාව
19. විගණන වාර්තාව පිළිබඳ පිළිතුරු වාර්තාව

# අපගේ දැක්ම

ගෝලීය රැකියා වෙළෙඳපොළෙහි අවශ්‍යතා
සපුරාලන ශ්‍රී ලංකාවේ ක්‍රියාශීලී හා
නිර්මාණශීලී පුහුණුව සපයන ප්‍රමුඛතම
ආයතනය වීම.

# අපගේ මෙහෙවර

වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි
නවීන ක්‍රමවේදයන් හා තාක්ෂණයන් මගින්
පුද්ගලයන් තුල නිපුණත්වයන් සංවර්ධනය කරමින්
ගෝලීය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලීම පිණිස
පහසුකම් සැලසීම.

අපගේ සේවාවන් හා පහසුකම් ඉහලම ප්‍රමිතියක
තබා ගනිමින් හා ගෝලීය රැකියා ප්‍රවණතාවයන්
ඉලක්ක කර ගනිමින් අපි මෙම මෙහෙවර සාක්ෂාත්
කර ගන්නෙමු.

# කාර්යයන්

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා බාහිර ආයතනද සම්බන්ධ කර ගනිමින් තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව හා නිපුණතාව ලබාදීම.

- නිපුණතා පාදක අවසන් ඇගයීම් පැවැත්වීම, ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීම, වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම හා වාර්තා නිකුත් කිරීම.

- ජාතික වෘත්තීය පරීක්ෂණ හා අවසන් පරීක්ෂණ පැවැත්වීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීම.

- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම.

- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන ලබාදීම.

- වෘත්තීය පුහුණුව ලැබූ තරුණ පිරිසට වැඩිදුර පුහුණුව ලබාදීම, රැකියාගත කිරීම සහ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම.



# හැඳින්වීම

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී.

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වගන්තියට අනුව පත් කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ඇතුළු සාමාජිකයන් 12 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විතය.

2015.01.01 සිට 2015.12.31දක්වා වසර තුළ විටින් විට පත් වූ අධ්‍යක්ෂ මණ්ඩල තුනකින් පහත සඳහන් පරිදි පාලක මණ්ඩලය ක්‍රියාත්මක විය.

2015.03.04 සිට 2015.04.22

| | | |
|---|---|---|
| 01 | නිමල් බෝපගේ මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (2015.03.04) | සභාපති |
| 02 | ධම්සිරි බණ්ඩාර කරුණාරත්න මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (2015.03.06) | උප සභාපති |
| 03 | සී.ජී.සිරිවර්ධන මහතා | සාමාජික |
| 04 | එන්.ජී.දයාරත්න මහතා | සාමාජික |
| 05 | මහාචාර්ය භාද්‍රානි තෝරදෙනිය මහත්මිය<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | සාමාජික |
| 06 | ටිලාර් නාදුගල මහතා | සාමාජික |
| 07 | ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී.රණතුංග මහතා<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මහ ලේකම් කාර්යාලය | සාමාජික |
| 08 | එච්.යූ.ප්‍රේමතිලක මහතා<br>අධ්‍යාපන අමාත්‍යාංශය | සාමාජික |
| 09 | ශීතා සේනාරත්න මහත්මිය<br>කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | සාමාජික |

2015.04.22 සිට 2015.11.11

| | | |
|---|---|---|
| 01 | ඉංජිනේරු (ආචාර්ය) ලයනල් පින්ටු මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (2015.04.22) | සභාපති |
| 02 | ඩී.ජී.දයාරත්න මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය(2015.04.23) | උප සභාපති |
| 03 | පූජ්‍ය මාවනේ නන්දසාර හිමි<br>ශ්‍රී ධර්ම ගවේශී ධර්ම නිකේතනය | සාමාජික |
| 04 | ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී.රණතුංග මහතා<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මහ ලේකම් කාර්යාලය | සාමාජික |
| 05 | එච්.එල්.ඔබේසේකර මහතා<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | සාමාජික |
| 06 | එච්.යූ.ප්‍රේමතිලක මහතා<br>අධ්‍යාපන අමාත්‍යාංශය | සාමාජික |
| 07 | චාන්දනී අමරතුංග මහත්මිය<br>කම්කරු දෙපාර්තමේන්තුව | සාමාජික |
| 08 | ශීතා සේනාරත්න මහත්මිය<br>කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | සාමාජික |
| 09 | බී.වික්‍රමතුංග මහතා | සාමාජික |
| 10 | ඩී.එච්.ඩබ්.සෙනෙවිරත්න මහතා | සාමාජික |
| 11 | තුසිත රංජන් හල්පත්දෙණිය මහතා | සාමාජික |

2015.11.11 සිට

| | | |
|---|---|---|
| 01 | මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | සභාපති |
| 02 | නීතිඥ සුගත් හඳුන්ගේ මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | උප සභාපති |
| 03 | ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී.රණතුංග මහතා<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මහ ලේකම් කාර්යාලය | සාමාජික |
| 04 | ඒ.ඩී. රංජිත් මහතා | සාමාජික |
| 05 | චාන්දනී අමරතුංග මහත්මිය<br>කම්කරු දෙපාර්තමේන්තුව | සාමාජික |
| 06 | ජේ.වයි.පීරිස් මහතා<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | සාමාජික |
| 07 | ඒ.පාලිත ද සිල්වා මහතා | සාමාජික |
| 08 | එච්.එම්.සිරිවිමල් හේරත් මහතා | සාමාජික |
| 09 | ආචාර්ය එම්.එම්.වේහැල්ල මහත්මිය | සාමාජික |
| 10 | ඇන්ටන් පෙරේරා  මහතා | සාමාජික |
| 11 | නිලාන් වික්‍රමසිංහ මහතා | සාමාජික |

# පාලක මණ්ඩලයේ වාර්තාව

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනය 1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ පිහිටුවන ලදී. 2015 වර්ෂයේදී ක්‍රියාත්මක වූ ජාතික වෘත්තීය පුහුණු ආයතන 07 ක්, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 194 ක් තුලින් හා සමාජ සත්කාරක කාර්යයක් වූ බන්ධනාගාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන 13 කින් සමන්විත මධ්‍යස්ථාන ජාලයක් තුලින් තරුණ තරුණියන්ට කුසලතා පුහුණුව ලබාදෙනු ලැබීය.2015 වර්ෂයේදී එහි පරමාර්ථයන්ට අනුව අත්පත් කරගන්නා ලද ජයග්‍රහනයන් පහත පරිදි වේ.

1. දිවයින පුරා පිහිටි මධ්‍යස්ථාන 223දී පාසල් අධ්‍යාපනය නිමා කළ තරුණ තරුණියන් 24141කටත් බන්ධනාගාර රැඳවියන් 410 කටත් පූර්ණ කාලීනව වෘත්තීය පුහුණුව ලබාදීම.

2. ඒ ඒ ක්ෂේත්‍රයන් හි නියලෙන්නන්ගේ වෘත්තීය සංවර්ධනයට හා අභිමත වෘත්තීන්ට පිවිසීමට බලාපොරොත්තු වන ආධුනිකයින් 1515 දෙනෙකු සඳහා අර්ධ කාලීන පුහුණුව ලබාදීම.

3. පුහුණුව සාර්ථකව අවසන් කල ආධුනිකයින් දේශීය රැකියා අවස්ථා 4696 ක් විදේශීය රැකියා අවස්ථා 169 ක් හා ස්වයං රැකියා 776 ක් වශයෙන් ආධුනිකයින් 5641 ක් රැකියා සඳහා යොමු කිරීම.

4. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 29 ක් පැවැත්වීම හා ස්වයං රැකියා උත්පාදන මූලාරම්භ ණය (SEPI) යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපාර ආරම්භ කර ඇති පුහුණුලාභීන් 90 ක් සඳහා රුපියල් මිලියන 25.44 ක් රාජ්‍ය බැංකු මඟින් ණය පහසුකම් ලබාදීම හා වෙනත් ණය යෝජනා ක්‍රම මඟින් පුහුණුලාභීන් 41 සඳහා රුපියල් මිලියන 10.5 ක් ලබාදීම.

5. NVQ සුදුසුකම් සපුරන ලද ආධුනිකයින් 10247 දෙනෙකු හා NVQ නොවන පාඨමාලා මඟින් සුදුසුකම් සපුරන ලද ආධුනිකයින් 3170 දෙනෙකු සඳහා සහතිකපත් නිකුත් කිරීම.

6. මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ අධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා වැඩසටහන් 21 ක් මඟින් 734 දෙනෙකු හා අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා වැඩසටහන් 15 ක් මඟින් 161 දෙනෙකු සඳහා පුහුණුව ලබාදීම.

7. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 3831 ක් පැවැත්වීම මඟින් 162664 දෙනෙකු වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීම.

8. ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලා 140 ක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලබා ගැනීම. ප්‍රතීතනය වී ක්‍රියාත්මක කරන මුළු පාඨමාලා සංඛ්‍යාව 928 කි.

9. දේශීය හා විදේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉල්ලුමක් පවතින ඉදිකිරීම් යන්ත්‍ර හා බර වාහන ක්‍රියාකරු පුහුණු පාඨමාලාව සඳහා අම්බලන්ගොඩ රවී කන්ස්ට්‍රක්ෂන් පුහුණු ආයතනය හා එක්ව කටයුතු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමට එළඹීම සහ මේ වන විට පුහුණුවන්නන් 217 ක් පුහුණු කිරීම.

10. 2015 ජනවාරි මස BMICH හි පැවැති EDEX රැකියාපොළ හා ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය නියෝජනය කරමින් වෘත්තීය මාර්ගෝපදේශන අංශය ඉදිරිපත් කල ප්‍රදර්ශන කුටියට Best Social Impact Stall සම්මානය දිනා ගැනීම.

11. ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පුහුණු මධ්‍යස්ථාන 12ක රුපියල් මිලියන 257.5 වැය කොට සංවර්ධන කටයුතු සිදු කිරීම හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිලාවේලි මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 169 ක් වෙන් කිරීම.

12. ප්‍රධාන කාර්යාලයේ අංශ 04ක, දිස්ත්‍රික් හා ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන 09 ක වාර්ෂික විගණන කටයුතු සම්පූර්ණ කිරීම හා විශේෂ විගණන පරීක්ෂණ 11ක් සිදුකිරීම.

13. උතුරු පළාතේ තරුණ තරුණියින් සඳහා හෝටල් ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ලබා ගැනීමට හැකිවන පරිදි "Jet wing" සමාගම සහ GIZ ව්‍යාපෘතිය සමඟ කටයුතු කරමින් පුහුණු ධාරිතාව 72කින් ඉහල නැංවීමට කටයුතු කිරීම.

14. පුහුණු මධ්‍යස්ථාන 18ක් සඳහා තත්ව කළමණාකරන පද්ධතිය (QMS) ස්ථාපනය කිරීමට කටයුතු කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

15. UNICEF ව්‍යාපෘතියේ ආධාර මත මුලතිව් දිස්ත්‍රිකයේ පුහුණු මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය හා පුහුණු පාඨමාලා 04ක් NVQ 4 මට්ටමට ප්‍රතිතනය කිරීම.

16. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 27ත් දෙනෙකු ඔවුන්ගේ නිපුණතා සංවර්ධන සඳහා විදේශීය පුහුණුවට යොමු කිරීම.

17. අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩුව පැවති තනතුරු 146 සඳහා බඳවා ගැනීම් කටයුතු සිදුකිරීම.

# 2016 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

- දිවයින පුරා තරුණ තරුණියන් 30000කට පූර්ණ කාලීන වෘත්තිය පුහුණුව ලබාදීම.
- රැකියාවන්හි නිරත වූවන් සහ රැකියා අපේක්ෂිතයන් 5000කට අර්ධ කාලීනව වෘත්තීය පුහුණුව ලබාදීම.
- ප්‍රතිතනය කිරීමට ඇති පාඨමාලා 164ක් ප්‍රතිතනය කර අවසන් කිරීම.
- සියළු පාඨමාලා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය මඟින් ක්‍රියාත්මක කර වීම.
- ප්‍රධාන පුහුණු මධ්‍යස්ථාන 50ක් සඳහා තත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම.
- වෘත්තිය මාර්ගෝපදේශ පිළිබඳ දිවයින පුරා පාසල් සිසුන්, පාසල් හැරගිය තරුණ තරුණියන් වෘත්තීය පුහුණුලාභීන්, දෙමව්පියන්, ගුරුවරුන් හා වෙනත් සමාජ සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 4056 මඟින් 141960 දෙනෙකු දැනුවත් කිරීම.
- සාර්ථකව පුහුණුව අවසන් කරන පුහුණුලාභීන් ව්‍යාපාර ආරම්භ කිරීමට දිරිගැන්වීමක් ලෙස ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 32ක් පවත්වා SEPI ණය යෝජනා ක්‍රමය යටතේ 160 දෙනෙකු සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවත්නා ව්‍යාපාර සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සලසා දීම.
- පුහුණුව අවසන් කරන ආධුනිකයන් 7000කට දේශීය රැකියාද 500 කට විදේශ රැකියාද 800ක් ස්වයං රැකියා සඳහාද යොමු කිරීම.
- පුහුණුව අවසන් කරන ආධුනිකයන් රැකියා ගත කිරීම හා වැඩිදුර පුහුණු අවස්ථා ලබාදීම අරමුණු කරගෙන රැකියා වෙළඳපොළ 10ක් තෝරාගත් දිස්ත්‍රික් 10 ක පැවැත්වීම.
- පුහුණුව ලබන ආධුනිකයන්ගේ දැනුම කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා 87ක් ද, කුසලතා සංවර්ධන වැඩසටහන් 40ක්ද පැවැත්වීම.
- NVQ සහතික 15000ක්, non NVQ 1000, RPL(NVQ) 750 අර්ධ කාලීන පාඨමාලාවල සහතික 1500 ලෙස සහතික 18250 නිකුත් කිරීම.
- තොරතුරු තාක්ෂණ පුහුණු ක්ෂේත්‍රයේ Web Designing සහ System Administrator නව පාඨමාලා ආරම්භ කිරීම.
- පොළොන්නරුව දිස්ත්‍රිකයේ මැදිරිගිරිය මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම,තවත් දිස්ත්‍රික් 07ක පුහුණු මධ්‍යස්ථාන වල ගොඩනැගිලි රුපියල් මිලියන 72.5ක් වැයකර සංවර්ධනය කිරීම හා රුපියල් මිලියන 5ක් වැය කර වැවල හා නියාගම පුහුණු මධ්‍යස්ථාන වල ඉඩම් හා ඉඩම් සංවර්ධනය කටයුතු සිදුකිරීම.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹීම මඟින් ඉදිකිරීම් යන්ත්‍ර හා බරවාහන ක්‍රියාකරු ක්ෂේත්‍රයේ නව පාඨමාලා ආරම්භ කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ හා දිවයිනේ සියළුම දිස්ත්‍රික් කාර්යාල හා ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආවරණය වන පරිදි විධිමත් විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි (විශ්‍රාමික)
සභාපති / ප්‍රධාන විධායක නිළධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

# ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය

සභාපති : මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි (විශ්‍රාමික)

උප සභාපති : නීතිඥ සුගත් හදුන්ගේ

අධ්‍යක්ෂ ජනරාල් : එච්. චූලාංගනී පෙරේරා මිය

අධ්‍යක්ෂවරු :
1. කේ.ජේ.කෝරළගේ මහතා
2. සමන් කුලසූරිය මහතා
3. ආචාර්ය සිද්ධිකා ජී සේනාරත්න මිය
4. පී.බී.ආර්.මඩවල මහතා
5. ඩබ්.ඒ.රණවීර මහතා (2015.04.23 සිට)
6. එච්.යූ.කාරියවසම් (වැ.බ 2015.05.07 දින සිට)

ප්‍රධාන අභ්‍යන්තර විගණක : පී.එම්.විජේසිංහ මහතා (රාජකාරී ඉටුකිරීම 2015.05.08 දින සිට)

නියෝජ්‍ය අධ්‍යක්ෂවරු :
1. එන්.ඩී.පී. ධම්මික මහතා
2. එන්.එස්.ඩී. නවරත්න මහතා
3. යූ.කේ. නන්ද මහතා
4. ඒ.කේ. ආරච්චිගේ මහතා
5. ඊ.ඒ.ඩී.එස්. සේනාරත්න මහතා
6. ජී.වී.පී.එන්.පෙරේරා මහතා
7. ආර්.එන්.කේ.එම්.ජේ. සේනෙවිරත්න මහතා
8. එන්.කේ. ඉලේසිංහ මහතා
9. එච්.ටී.එස්. වික්‍රමරත්න මහතා
10. එච්.ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා
11. එස්.එම්. එදිරිසිංහ මිය
12. එම්.එම්.එන්.බී. මධුරසිංහ මහතා
13. ඩී.ආර්.එස්.එල්. දසනායක මහතා
14. ටී.ඩී.එස්.එල්. සංසදාස මහතා
15. ඩබ්.ජී. විජේරත්න මහතා
16. එච්.පී. මනම්පේරි මහතා
17. ඒ.එම්.ටී.එස්. ආටිගල මහතා

සහකාර අධ්‍යක්ෂවරු

1. ටී. විනෝද්රාජා මහතා
2. ඒ.ඒ. ජබීර් මහතා
3. ඒ.එම්.ඒ. ජයතිස්ස මහතා
4. ජී.ඩී. ජයසිංහ මහතා
5. ජී.ආර්.එම්.සී. කුලතුංග මිය
6. පී.බී.ජී.අයි.බී. වැගන්තලේ මහතා
7. රාධක්‍රිෂණන් මධුරතන් මහතා
8. කේ. නිරංජන් මහතා
9. ඒ.ඒ.ඩබ්.ජී.ආර්.ආර්. බණ්ඩාර මහතා
10. වී.ජී. නිමල්සිරි මහතා
11. පී.එන්. අබේසිංහ මහතා
12. ජී.එල්.ඒ. පීරිස් මහතා
13. ඩී.ඒ.එස්. අතුකෝර්ල මහතා
14. ආර්.එම්.ආර්. රත්නායක මහතා
15. බී.එච්.ඒ. නෙල්සන් මහතා
16. එස්. මැද්දේගොඩ මහතා
17. සී.ජේ. විදානපතිරණ මහතා
18. එච්.ඒ.පී. ගුණවර්ධන මහතා
19. එම්.ජී.ජී. සමන් මහතා
20. කේ.ඩී.එන්. ද සිල්වා මහතා
21. ඩී.ඒ. ජයරත්න මහතා
22. වී. කනගසුන්දරම් මහතා
23. ආර්. සුනිල් මහතා
24. ජී.එච්.පී. දමයන්ති මිය
25. එන්.එම්.ඩබ්.කේ. හේරත් මිය
26. පී.ජේ. ජයවර්ධන මිය
27. එම්.කේ.බී. ජයතිලක මහතා
28. එච්.එම්. ජයන්ත මහතා
29. එම්.බී. නලීම් මහතා
30. ආර්. පතිරගේ මිය
31. පී.ජී. ප්‍රසන්න මහතා
32. එච්. එදිරිසිංහ මිය
33. ඒ.ඒ.ඩී.ටී. ශාන්ත මහතා
34. ටී.වී.ඩබ්. දේවප්‍රිය මහතා
35. යූ.ජී.ජේ. ප්‍රියදර්ශන මහතා
36. ජී.එම්.එස්. පෙරේරා මහතා
37. ආර්.ඩී. ප්‍රදීපිකා මිය
38. ජේ. ඉනෝකා යූ.පී. ගුණවර්ධන මෙනෙවිය
39. ඊ.ජේ. විජේතුංග මහතා
40. ඩබ්.එම්.ඒ.එස්.එල්. විජේනායක මිය
41. එච්.එල්. සිසිර මහතා
42. ඩබ්.කේ. සුමිත් වසන්ත මහතා
43. ඩී.එස්.එදිරිසිංහ මහතා (2015.07.27 දක්වා)
44. ආර්. අභිලන් මහතා
45. එච්.ටී.ඩී.ආර්.එස්. විජේසිංහ මහතා
46. තිළිණ රණසිංහ මහතා
47. ජී.ඩී. ශ්‍යාමලී මිය
48. සී.ඩී. සමරනායක මහතා
49. සී.යූ.එම්.කොඩිතුවක්කු මිය
50. සුනිල් අබේසිංහ මහතා
51. ජී.කේ.ඩී.සී. කුමාර මහතා
52. එස්.එම්.ජේ. සුවේන්ද්‍ර මහතා
53. එස්.එම්.එම්.කේ. සියමුදලි මිය
54. එන්.කේ. අඹගහවත්ත මිය
55. ඩී.සී.ඕ.විතාන මිය
56. ඒ.ඩී. එස්. සමරසිංහ මහතා
57. ඒ.පී. ජගත් නිශාන්ත මහතා
58. පී.එම්. පෙරේරා මහතා (2015.04.04 දක්වා)
59. නීති නිලධාරි / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් -
ඩබ්.ජී.ඊ.එම්. ජිනදාස මෙනවිය

# කාර්යය මණ්ඩල තොරතුරු

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා 2015 වර්ෂයට අනුමත කාර්යය මණ්ඩලය 2438 කි. කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2015.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව 1894 කි.

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය | සේවා කාණ්ඩය |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 | HM 2-1 |
| 02 | අධ්‍යක්ෂ | 6 | 5 | 1 | HM1-1 |
| 03 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | |
| 04 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ | 86 | 73 | 13 | MM 1-1 |
| 05 | නීති නිළධාරී | 1 | 1 | 0 | |
| 06 | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | |
| 07 | ඉංජිනේරු | 1 | 0 | 1 | |
| 08 | පරිපාලන නිළධාරී | 2 | 2 | 0 | JM 1-1 |
| 09 | පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී | 12 | 6 | 6 | |
| 10 | විමර්ශන නිළධාරී | 1 | 0 | 1 | |
| 11 | ප්‍රවාහන නිළධාරී | 1 | 0 | 1 | |
| 12 | සැපයුම් නිළධාරී | 1 | 0 | 1 | |
| 13 | මුද්‍රණ නිළධාරී | 1 | 1 | 0 | |
| 14 | අභ්‍යන්තර විගණන නිළධාරී | 3 | 1 | 2 | |
| 15 | පද්ධති විශ්ලේෂක | 1 | 0 | 1 | |
| 16 | සුභසාධක නිළධාරී | 1 | 1 | 0 | |
| 17 | ගිණුම් නිළධාරී | 33 | 30 | 3 | |
| 18 | ජොෂ්ඨ වැඩසටහන් නිළධාරී | 10 | 5 | 5 | |
| 19 | පුහුණු නිළධාරී | 74 | 54 | 20 | |
| 20 | පර්යේෂණ නිළධාරී | 2 | 0 | 2 | |
| 21 | සැළසුම් නිළධාරී | 2 | 2 | 0 | |
| 22 | සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර | 1 | 0 | 1 | |
| 23 | පෞද්ගලික සහකාර* | 7 | 5 | 0 | |

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය | සේවා කාණ්ඩය |
|---|---|---|---|---|---|
| **24** | භාෂා පරිවර්තක(සිංහල/ඉංග්‍රීසි) | 1 | 0 | 1 | MA 5-2 |
| **25** | භාෂා පරිවර්තක(සිංහල/දෙමළ) | 3 | 0 | 3 | |
| **26** | ජොෂ්ඨ උපදේශක | 146 | 17 | 129 | MA 4 |
| **27** | වැඩසටහන් නිළධාරී | 69 | 64 | 5 | |
| **28** | විගණන සහකාර* | 3 | 2 | 0 | |
| **29** | ව්‍යාපෘති සහකාර* | 34 | 15 | 0 | MA 3 |
| **30** | තාක්ෂණික සහකාර | 3 | 1 | 2 | MA 2-2 |
| **31** | උපදේශක | 1414 | 1163 | 251 | |
| **32** | ක්‍රීඩා උපදේශක | 31 | 0 | 31 | |
| **33** | සැලසුම් ශිල්පී | 1 | 0 | 1 | |
| **34** | ප්‍රමාණ සමීක්ෂක | 2 | 0 | 2 | |
| **35** | කාර්මික නිලධාරී(සිවිල්) | 5 | 0 | 5 | |
| **36** | කළමණාකරණ සහකාර | 191 | 188 | 3 | MA 1-2 |
| **37** | සහකාර උපදේශක(LRUC)* | 38 | 33 | 0 | |
| **38** | ඇමුණුම්කරු (මුද්‍රණ) | 3 | 1 | 2 | |
| **39** | නිවාඩු නිකේතන භාරකරු | 2 | 1 | 1 | |
| **40** | සුපරීක්ෂක (මුද්‍රණ) | 1 | 0 | 1 | |
| **41** | සුපරීක්ෂක(ගොඩනැගිලි) | 1 | 0 | 1 | |
| **42** | රියදුරු | 64 | 64 | 0 | PL 3 |
| **43** | ගබඩාකරු* | 2 | 2 | 0 | PL 2 |
| **44** | මුද්‍රණ සහායක | 3 | 2 | 1 | |
| **45** | බැඳුම්කරු (මුද්‍රණ) | 2 | 1 | 1 | |
| **46** | යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ) | 2 | 1 | 1 | |
| **47** | කාර්යාල සහයක | 8 | 5 | 3 | PL 1 |
| **48** | මුරකරු* | 65 | 53 | 0 | |
| **49** | කම්කරු | 95 | 92 | 3 | |
| | **එකතුව** | **2438** | **1894** | **505** | |

* දැනට සිටින පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුර අනුමත කර ඇත.ඉන්පසු අහෝසි වේ.

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසාන වන විට කාර්යය මණ්ඩලය | වර්ෂ අවසානයේ පුරප්පාඩු / අතිරික්තය |
|---|---|---|---|---|
| 01 | HM 2 -ජ්‍යේෂ්ඨ කළමනාකාර<br>HM 1 – 1 ජ්‍යේෂ්ඨ කළමනාකාර | 08 | 07 | 01 |
| 02 | MM -1-1 - කළමනාකාර | 89 | 75 | 14 |
| 03 | JM -1 – 1 කණිෂ්ඨ කළමනාකාර | 152 | 107 | 43 |
| 04 | MA 5 – 2 බලාත්මක කිරිමේ /ක්‍රියාත්මක කිරිමේ/ව්‍යාප්ති නිලධාරින් | 04 | 0 | 04 |
| 05 | MA 4 ක්‍රියාත්මක කිරිමේ / උපදේශන සේවා | 218 | 83 | 134 |
| 06 | MA 3 ආශ්‍රිත නිලධාරින් | 34 | 15 | 0 |
| 07 | MA 2 – 2 කළමනාකාර සහකාර - තාක්ෂණ | 1456 | 1164 | 292 |
| 08 | MA 1 – 2 කළමනාකාර සහකාර - තාක්ෂණ නොවන | 236 | 223 | 08 |
| 09 | PL – 3 ප්‍රාථමික ශිල්පී | 64 | 64 | 0 |
| 10 | PL – 2 ප්‍රාථමික අර්ධ ශිල්පී | 09 | 06 | 03 |
| 11 | PL – 1 ප්‍රාථමික ශිල්පී නොවන | 168 | 150 | 06 |
| | එකතුව | 2438 | 1894 | 505 |

# කාර්යය මණ්ඩලය පුහුණු කිරීම

2015 වර්ෂය තුල අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 734 දෙනෙකු සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ 161 දෙනෙකුගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ලැබීය.

2014/2015 වසර කණ්ඩායමේ උපදේශකවරු 88 දෙනෙකු ජාතික වෘත්තීය සුදුසුකම් පස්වන මට්ටමේ පාඨමාලාව සම්පූර්ණ කර ඇත. 2015 කණ්ඩායම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පස්වන මට්ටම ලබා ගැනීමට උපදේශකවරු 165 දෙනෙකු යොමුකර වීමට හැකිවිය.

එමෙන්ම උපදේශකවරුන් 111 දෙනෙකු සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාල නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබීය.

අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 27 දෙනෙකු ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය සඳහා විදේශීය පුහුණුවට යොමු කරනු ලැබීය.





# විදේශීය පුහුණුව - 2015

| | ශිෂ්‍යත්වය | රට | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ඉගැන්වීමේ ක්‍රමවේදයන් පිළිබඳ පුහුණු වැඩසටහන් | සිංගප්පූරුව | 12 |
| 02 | වෘත්තීය අධ්‍යාපනය කළමණාකරණ පුහුණු වැඩසටහන | චීනය | 3 |
| 03 | සිස්කෝ සාමාජිකයන්ගේ වාර්ෂික රැස්වීම | තායිලන්තය | 2 |
| 04 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අත්කම් භාණ්ඩ සහ ගෙතීමේ තාක්ෂණය සඳහා වූ පුහුණු වැඩසටහන | චීනය | 5 |
| 05 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ ස්වර්ණාභරණ සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | චීනය | 4 |
| 06 | දෙමුහුම් තාක්ෂණය සඳහා මෝටර් රථ විදුලිය සහ එන්ජින් පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන | මැලේසියාව | 1 |
| 07 | තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන | සිංගප්පූරුව | 1 |
| 08 | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | කොරියාව | 2 |
| 09 | ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආශ්‍රිතව ජීව තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන | ඉන්දියාව | 1 |
| 10 | උසස් කළමණාකරණය පිළිබඳ ජාත්‍යාන්තර පුහුණු වැඩසටහන | තායිලන්තය | 2 |
| 11 | ආගන්තුක සත්කාර කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | සිංගප්පූරුව | 15 |
| | **එකතුව** | | **48** |

# දේශීය පුහුණුව (අනධ්‍යයන කාර්යය මණ්ඩලය) – 2015

| | පුහුණු වැඩසටහන | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| **01** | තොරතුරු කළමණාකරණය පිළිබඳ මූලික සංකල්ප පිළිබඳ වැඩමුළු | 01 |
| **02** | අධීක්ෂණ කළමණාකරණ පුහුණු වැඩසටහන | 02 |
| **03** | රියදුරු තනතුරේ කාර්යභාර්ය දැනුවත් කිරීමේ වැඩමුළුව | 62 |
| **04** | බඳවා ගැනීමේ පරිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 04 |
| **05** | මුදල් අයකැමිගේ වගකීම හා භූමිකාව පිළිබඳ පුහුණු වැඩසටහන | 01 |
| **06** | මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන | 74 |
| **07** | ව්‍යාපාර සංඛ්‍යානය සහ සංඛ්‍යා තත්ව පාලනය පිළිබඳ වැඩමුළුව | 01 |
| **08** | මූලික සංඛ්‍යානය සහ සංඛ්‍යාන විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව | 02 |
| **09** | ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ වාර්ෂික වැඩමුළුව | 10 |
| **10** | නිපුණතා වර්ධන පුහුණුව හා ව්‍යවසායකත්ව හැකියා වර්ධන පුහුණුව | 01 |
| **11** | ඉදිකිරීමේ ක්ෂේත්‍රය සම්බන්ධ නීති රීති | 02 |
| **12** | AAT වාර්ෂික සම්මේලනය - 2015 | 01 |
| | **එකතුව** | **161** |

# දේශීය පුහුණුව (අධ්‍යයන කාර්යය මණ්ඩලය) – 2015

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| **01** | පුහුණු ක්‍රමවේදය | 154 |
| **02** | ප්‍රගති සමාලෝචනය පිළිබඳ වැඩසටහන | 390 |
| **03** | පුහුණු කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 66 |
| **04** | කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන | 92 |
| **05** | නව උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන | 32 |
| | **එකතුව** | **734** |

# වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම

විවිධ ක්ෂේත්‍ර 18 කට අයත් වූ පුහුණු පාඨමාලා 120 ක් යටතේ ක්‍රියාත්මක වූ පුහුණු වැඩසටහන් 1953 කින් ආධුනිකයින් 28,745 දෙනෙකු ආයතනික පුහුණුව සඳහා ඇතුළත් කරගනු ලැබීය. ඊට අමතරව කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් 3247 දෙනෙක් සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් මඟින් 564 දෙනෙක් පුහුණු කරනු ලැබීය. ඒ අනුව 2015 වර්ෂයේ පුහුණුව සඳහා ඇතුලත්වූ සමස්ථ ආධුනික සංඛ්‍යාව 32556 කි.

# වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම/පුහුණුව අවසන් කිරීම

| වර්ෂය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව | 31,907 | 31591 | 32556 |
| පුහුණුව අවසන් කල සංඛ්‍යාව | 26,869 | 21976* | 27952 |

* පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින් සංඛ්‍යාව 2763 දෙනෙකු 2016 වසරේදී පුහුණුව අවසන් කිරීමට නියමිතය.



# පුහුණු ක්ෂේත්‍ර සඳහා ආධුනික ඉල්ලුම - 2015

| | ක්ෂේත්‍රය | ඇතුලත් වු ආධුනික සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත් | 46 |
| 2 | මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව | 2883 |
| 3 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 3078 |
| 4 | විදුලි,විද්‍යුත් සහ විදුලි සංදේශ | 3324 |
| 5 | ධීවර හා මත්ස්‍ය වගාව | 32 |
| 6 | ආහාර තාක්ෂණය | 513 |
| 7 | මැණික් හා ස්වර්ණාභරණ | 111 |
| 8 | හෝටල් හා සංචාරක | 1392 |
| 9 | තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය | 7087 |
| 10 | සම් ආශ්‍රිත නිෂ්පාදන | 95 |
| 11 | ලෝහ හා ලුහු ඉංජිනේරු | 1218 |
| 12 | කාර්යාල කළමණාකරණය | 97 |
| 13 | දැව ආශ්‍රිත | 1267 |
| 14 | පුද්ගල හා සමාජ | 3358 |
| 15 | මුද්‍රණ හා ඇසුරුම් | 51 |
| 16 | ශීතකරණ හා වායුසමීකරණ | 573 |
| 17 | රෙදිපිළි හා ඇගළුම් | 3562 |
| 18 | වෙනත් | 58 |
| | **එකතුව** | **28745** |





පුහුණුවට බඳවාගැනීම - 2015
4500
4000
3500
3000
2500
2000
1500
1000
500
0
කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත්
මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව
ගොඩනැගිලි හා ඉදිකිරීම
විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ
ධීවර හා මත්ස්‍ය වගාව
ආහාර තාක්ෂණය
මැණික් හා ස්වර්ණාභරණ
හෝටල් හා සංචාරක
තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය
සම ආශ්‍රිත නිෂ්පාදන
ලෝහ හා ප්‍රමු ඉංජිනේරු
කාර්යාල කළමණාකරණය
දැව ආශ්‍රිත
පුද්ගල හා සමාජ
මුද්‍රණ හා ඇසුරුම
ශීතකරණ හා වායුසමීකරණ
රෙදිපිළි හා ඇගළුම
වෙනත්
පිරිමි
ගැහැණු







| | Level 2 | Level 3 | Level 4 | Level 5 | Non |
|---|---|---|---|---|---|
| පිරිමි | 66 | 11062 | 4649 | 417 | 1369 |
| ගැහැණු | 92 | 2402 | 7430 | 204 | 1054 |

# පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2015 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ. එයට අමතරව බන්ධනාගාර 13කුත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන 01 කුත් වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්විය.

| වර්ෂය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| ජාතික වෘත්තීය පුහුණු ආයතන | 08 | 07 | 07 |
| දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 22 | 22 | 22 |
| වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 232 | 221 | 194 |
| එකතුව | **262** | **250** | **223** |



# වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2015

| පළාත | දිස්ත්‍රික්කය | ආයතන සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | NVTI | DVTC | VTC | AT | PC | Reh | Total |
| බස්නාහිර | ගම්පහ | - | 1 | 13 | 1 | 1 | - | 16 |
| | කොළඹ | 2 | 1 | 12 | 1 | 1 | - | 17 |
| | කළුතර | - | 1 | 7 | - | 1 | - | 9 |
| වයඹ | පුත්තලම | - | 1 | 5 | 1 | - | - | 7 |
| | කුරුණෑගල | - | 1 | 7 | - | - | - | 8 |
| උතුර | යාපනය | - | 1 | 7 | - | - | - | 8 |
| | කිලිනොච්චිය | - | 1 | 4 | - | - | - | 5 |
| | මුලතිව් | - | 1 | 2 | - | - | - | 3 |
| | මන්නාරම | - | - | 1 | - | - | - | 1 |
| | වව්නියාව | - | 1 | 6 | 1 | - | - | 8 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | - | 1 | 6 | - | - | - | 7 |
| | මඩකලපුව | 1 | - | 12 | - | - | - | 13 |
| | අම්පාර | - | 1 | 13 | 2 | - | - | 16 |
| දකුණ | ගාල්ල | 2 | 1 | 10 | 2 | 2 | - | 17 |
| | මාතර | 1 | - | 13 | 1 | - | - | 15 |
| | හම්බන්තොට | 1 | 1 | 10 | - | 1 | - | 13 |
| සබරගමුව | කෑගල්ල | - | 1 | 8 | - | - | - | 9 |
| | රත්නපුරය | - | 1 | 10 | 1 | 2 | - | 14 |
| ඌව | බදුල්ල | - | 1 | 7 | - | 1 | - | 9 |
| | මොණරාගල | - | 1 | 8 | - | 1 | - | 10 |
| මධ්‍යම | මහනුවර | - | 1 | 10 | - | 2 | - | 13 |
| | මාතලේ | - | 1 | 5 | - | - | - | 6 |
| | නුවරඑළිය | - | 1 | 4 | - | - | - | 5 |
| උතුරු මැද | අනුරාධපුර | - | 1 | 10 | - | - | - | 11 |
| | පොලොන්නරුව | - | 1 | 4 | - | 1 | 1 | 7 |
| | එකතුව | **7** | **22** | **194** | **10** | **13** | **1** | **247** |

**NVTI** : ජාතික වෘත්තීය පුහුණු ආයතන
**DVTC** : දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
**VTC** : වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
**AT** : අනුබද්ධිත
**PC** : බන්ධනාගාර
**Reh** : පුනරුත්ථාපන මධ්‍යස්ථාන

# වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

විවිධාකාර තරුණ කණ්ඩායම් ඉලක්ක කරමින් ඔවුන් සුදුසු වෘත්තියකට යොමු කිරීම සඳහා දිවයින පුරා මාර්ගෝපදේශන වැඩසටහන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවත්වනු ලබයි.

ඒ සඳහා දිවයින පුරා පිහිටුවා ඇති වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකක මඟින් තරුණ තරුණියන් හට ඔවුන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟ පෙන්වනු ලැබේ.

ඒ අනුව 2015 වසරේ දී පාසැල් සිසුන්, පාසැල් හැරයන්නන්, දෙමව්පියන්, ගුරුවරුන් හා ක්ෂේත්‍ර නිලධාරින් සඳහා වැඩසටහන් 3831 ක්‍රියාත්මක කර 162,664 දෙනෙකු දැනුවත් කිරීමට හැකි විය.

| ඉලක්කගත කණ්ඩායම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසැල් සිසුන් | 1228 | 61023 |
| පාසැල් හැරයන්නන් | 781 | 31184 |
| වෙනත් | 1822 | 70457 |
| එකතුව | 3831 | 162664 |

| වර්ෂය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| සහභාගි වූ සංඛ්‍යාව | 115,736 | 136,663 | 162,664 |



# වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය







# රැකියාගත කිරීම

දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන රැකියාගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ලියාපදිංචි විදේශීය හා දේශීය රැකියා ආයතන මගින් පුහුණුලාභීන් 5641 දෙනෙකු රැකියාගත කරන ලදි. ඉන් 4696 දෙනෙකු දේශීය රැකියා සඳහාද 169 දෙනෙකු විදේශීය රැකියා සඳහාද 776 දෙනෙකු ස්වයං රැකියා සඳහාද යොමු කරනු ලැබිණි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය රැකියා ආයතන 97 ක් ලියාපදිංචි කරන ලදි. මෙසේ ඵලදායි ලෙස රැකියාගත කිරීම තුලින් ජාතික ආර්ථිකයට රුපියල් මිලියන 163කින් පමණ දායකත්වයක් ලබාදීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට හැකිවිය.

| අංකය | පුහුණු ක්ෂේත්‍රය | රැකියා ගත කල සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
| 01. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 469 | 16 | 88 | 573 |
| 02. | මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව | 582 | 25 | 68 | 675 |
| 03. | විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ | 774 | 46 | 76 | 896 |
| 04. | ශීතකරණ හා වායු සමීකරණ | 144 | 09 | 09 | 162 |
| 05. | ආහාර තාක්ෂණය | 112 | 04 | 01 | 117 |
| 06. | සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය | 732 | 07 | 42 | 781 |
| 07. | හෝටල් හා සංචාරක | 327 | 19 | 12 | 358 |
| 08. | ලෝහ හා ලුහු ඉංජිනේරු | 303 | 11 | 19 | 333 |
| 09. | දැව ආශ්‍රිත | 147 | 01 | 48 | 196 |
| 10. | මැණික් හා ස්වර්ණාභරණ | 23 | 02 | 01 | 26 |
| 11. | මුද්‍රණ හා ඇසුරුම් | 24 | 0 | 0 | 24 |
| 12. | කෘෂිකර්මය, වැවිලි හා පශු සම්පත් | 0 | 0 | 0 | 0 |
| 13. | රෙදිපිළි හා ඇඟලුම් | 670 | 03 | 163 | 836 |
| 14. | පුද්ගල හා සමාජ | 335 | 18 | 238 | 591 |
| 15. | කාර්යාල කළමනාකරණය | 23 | 01 | 0 | 25 |
| 16. | ධීවර හා මත්ස්‍ය වගාව | 03 | 0 | 0 | 03 |
| 17. | සම් ආශ්‍රිත නිෂ්පාදන | 01 | 0 | 09 | 10 |
| 18. | වෙනත් | 27 | 08 | 01 | 36 |
| | එකතුව | **4696** | **169** | **776** | **5641** |



රැකියා ගත කිරීම
900
800
700
600
500
400
300
200
100
0
දේශීය
විදේශීය
ස්වයං
ගොඩනැගිලි හා ඉදිකිරීම්
මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව
විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ
ශීතකරණ හා වායු සමීකරණ
ආහාර තාක්ෂණය
සන්නිවේදනය හා බහු මාධ්‍ය...
හෝටල් හා සංචාරක
ලෝහ හා ලුහු ඉංජිනේරු
දැව ආශ්‍රිත
මැණික් හා ස්වර්ණාභරණ
මුද්‍රණ හා ඇසුරුම්
කෘෂිකර්මය, වැවිලි හා පශු සම්පත්
රෙදිපිළි හා ඇඟලුම්
පුද්ගල හා සමාජ
කාර්යාල කළමනාකරණය
ධීවර හා මත්ස්‍ය වගාව
සම් ආශ්‍රිත නිෂ්පාදන
වෙනත්




දේශීය
විදේශීය
ස්වයං
3%
8%
89%

# රැකියා ස්ථාපනය තුලින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

| වර්ගය | ස්ථාපනය කළ සංඛ්‍යාව | ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය (රු. මිලියන) |
|---|---|---|
| දේශීය රැකියා | 4696 | 130.93 |
| විදේශීය රැකියා | 169 | 11.24 |
| ස්වයං රැකියා | 776 | 20.87 |
| එකතුව | **5641** | **163.04*** |

***** **(තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ශ්‍රම වෙළඳපොල සඟරාව හා රැකියාගත කළ ආයතනයන්හී දත්ත මත 2015 වර්ෂයේ රැකියාගත කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව වසරකට ලබන ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.)**

| | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
|---|---|---|---|---|
| **2013** | 4316 | 103 | 555 | 4974 |
| **2014** | 2918 | 100 | 410 | 3428 |
| **2015** | 4696 | 169 | 776 | 5641 |

(සමාජීය ඉල්ලුම සහිත පාඨමාලා හැර අනෙකුත් පාඨමාලා සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් රැකියාගත කල තොරතුරු පමණි.)



# රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහසම්බන්ධතා මත ශිල්පීය දක්ෂතා වැඩමුළු පැවැත්වීම

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට තමාගේ දැනුම හා කුසලතාවය වර්ධනය කර ගැනීමටත් වෙනස් වන ලෝකයේ නව තාක්ෂණික දැනුම ලබා දීමත් අරමුණු කරගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒ අනුව 2015 වර්ෂයේදී පෞද්ගලික අංශයේ ආයතන 07ක සහය ඇතිව මෙවැනි වැඩසටහන් 44ක් ක්ෂේත්‍ර 07ක් සඳහා පැවැත්වීමට හැකි වූ අතර එමඟින් 3247 දෙනෙකුට තම හැකියාවන් වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව සැලසිනි.

| | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|---|---|
| **01** | ටයිල් ඇතිරීම | 16 | 617 | ලංකා ටයිල් |
| **02** | රූපලාවන්‍ය | 15 | 1852 | නේචර්ස් බියුටි ක්‍රියේෂන් පුද්ගලික සමාගම |
| **03** | විදුලි කාර්මික | 06 | 468 | ACL කේබල් සමාගම |
| **04** | බේකරි ආශ්‍රිත නිෂ්පාදන | 01 | 31 | AB මයුරි ලංකා සමාගම |
| **05** | මෝටර් සයිකල් සහ ත්‍රිවීල් රථ අලුත්වැඩියා | 03 | 153 | සී.ස.ඩේවිඩ් පීරිස් සමාගම |
| **06** | ගොඩනැගිලි සහ පින්තාරු | 02 | 51 | සී.ස. ඇක්සෝනොබල් පේන්ට් සමාගම |
| **07** | ඇළුමිනියම් ෆැබ්රිකේටර් | 01 | 75 | ස්විස්ටෙක් ඇළුමිනියම් ලිමිටඩ් |
| | එකතුව | **44** | **3247** | - |


S-1354B

# අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් තම අරමුණු කරා ගමන් කිරීමේදී ගත් විවිධ ක්‍රියා මාර්ග අතර වෘත්තීය පුහුණු අවස්ථා වැඩි දියුණු කිරීම හා එහි ගුණාත්මක බව වැඩි කිරීම තුළින් දේශීය හා විදේශීය වශයෙන් විවිධ රැකියා අවස්ථා බිහි කිරීම අරමුණු කර ගනිමින් 2015 වසර තුළ රාජ්‍යය හා පෞද්ගලික ආයතන 5ක් සමඟ අවබෝධය ගිවිසුම් අත්සන් කරනු ලැබීය.

| | අවබෝධතා ගිවිසුම | ආයතනය |
|---|---|---|
| **01** | ඉදිකිරීමේ යන්ත්‍ර හා බර වාහන ක්‍රියාකරු ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා අවස්ථා උදාකර දීම. | රවී කන්ස්ට්‍රක්ෂන් ආයතනය |
| **02** | බරවාහන ක්‍රියාකරු ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා අවස්ථා උදාකර දීම. | මඟ නැගුම මාර්ග ඉදිකිරීම් යන්තත්‍රෝපකරණ සමාගම |
| **03** | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා අවස්ථා උදාකර දීම. | වලස්මුල්ල තරුෂි ඇඟළුම් පුද්ගලික සමාගම |
| **04** | ජංගම දුරකථන අලුත්වැඩියා ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා අවස්ථා උදාකර දීම. | සැම්සුන් ඉන්දියා ඉලෙක්ට්‍රොනික් පුද්ගලික සමාගම |
| **05** | කුරුඳු කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා අවස්ථා උදාකර දීම. | සිනමන් ට්‍රේඩ්ස් ඇකඩමි පුද්ගලික සමාගම |

# ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය තරුණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ අරමුණින් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. 2015 වර්ෂයේදී දිවයින පුරා පැවති මෙවැනි වැඩසටහන් 29ක් මඟින් 564 දෙනෙකු පුහුණු කිරීමට හැකිවිය.

මෙවැනි වැඩසටහන් තුලින් ලබාගත් දැනුම උපයෝගි කර ගනිමින් ව්‍යාපාර සැළසුම් සකස් කර 2015 වසර තුලදී ව්‍යවසායකත්ව පුහුණුවලත් ආධුනිකයින් 90 දෙනෙකුට රුපියල් මිලියන 25කට ආසන්න මුදලක් ණය වශයෙන් මහජන බැංකුව, ලංකා බැංකුව වැනි රාජ්‍ය බැංකු වලින් ලබා ගැනීමට හැකි විය. එලෙස කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරයන් ආරම්භ කල තරුණ ව්‍යවසායකයින් දිවයින පුරා විසිරී සිටී.



# අභියෝග

- නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා හැකියාව ඇති උපදේශකවරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.
- පුහුණු ක්ෂේත්‍ර හා රැකියා අවස්ථා අතර ඇති නොගැලපීම අවම කර ගැනීම.
- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකටම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.
- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරඟකාරීව කටයුතු කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන මඟින් සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීමට අපහසුවීම.
- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම.
- ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැතිවීම.

## පිළිගැන්වීම

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තාව

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

සමාලෝචනයට භාජනයවූ වර්ෂය ඇතුළත මහභාණ්ඩාගාරය, අමාත්‍යාංශය සහ නිපුණතා අංශ සංවර්ධන ව්‍යාපෘතිය විසින් පහත විස්තර කර ඇති පරිදි රු. 1,697,097,206.39ක මුළු ප්‍රදානයක් අධිකාරිය වෙත මුදාහරිනු ලැබීය.

| 1.1 රජයේ ප්‍රදාන | ප්‍රතිපාදන (රු) | මුදාහරින ලද මුදල (රු) |
|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | 1,162,000,000.00 | 1,162,000,000.00 |
| භාණ්ඩාගාර ප්‍රදාන - මූලධන | 145,000,000.00 | 121,500,000.00 |
| නිපුණතා අංශ සංවර්ධන ව්‍යාපෘතිය | 1,001,530,000.00 | 411,427,087.14 |
| නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 2,170,119.25 | 2,170,119.25 |
| එකතුව | **2,310,700,119.25** | **1,697,097,206.39** |

| 1.2 ආදායම | අයවැය කළ (රු) | උපයන ලද ආදායම ශුද්ධ (රු) |
|---|---|---|
| ආදායම | **145,000,000.00** | **161,186,476.78** |

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලය සඳහා වන මූල්‍ය වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා මේ සමඟ ඉදිරිපත් කර ඇත.
පහත සඳහන් ලියකියවිලි ඊට ඇතුළත් කර ඇත.

1. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය දැක්වෙන වාර්තාව
2. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන වාර්තාව
3. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ වාර්තාව
4. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් දැක්වෙන වාර්තාව
5. මූල්‍ය වාර්තාව සඳහා සටහන්



මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි(විශ්‍රාමික)

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

## අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපතිතුමාගේ ප්‍රකාශය

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ වාර්තාව

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය වාර්තාව ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිතීන්ට අනුව සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ දක්වා ඇති ආකාරයට පිළියෙල කර ඇත.

වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ ගණුදෙනුවල සාර්ථකත්වය සහ කාර්යක්ෂමතාවය හැකිතාක් දුරට තහවුරු කරගැනීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් නියම කර ඇති මූල්‍ය නීතිරීති සහ ක්‍රියාපිළිවෙත් අනුගමනය කර ඇත. අපගේ උපරිම දැනුවත්කම අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වාර්තා සාර්ථක අන්දමට පිළියෙල කර ඇති අතර එයින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙහි මූල්‍ය තත්වය පිළිබඳව සත්‍ය සහ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් ප්‍රදර්ශනය කරනු ලබයි.



සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

**2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 2015 (රු.) | | 2014 (රු.) | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 2 | **5,258,307,033.48** | | 5,268,035,889.01 | |
| සිදු කෙරෙමින් පවතින ප්‍රධාන වැඩ | 3 | **128,920,347.07** | | 115,024,684.78 | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | | | | |
| ස්ථාවර තැන්පතු | | **25,000.00** | **5,387,252,380.55** | 25,000.00 | 5,383,085,573.79 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 4 | **30,326,332.31** | | 28,088,609.22 | |
| ලැබිය යුතු දෑ | 5 | **27,858,398.23** | | 22,477,991.11 | |
| සේවක මණ්ඩල ණය | 6 | **45,363,743.66** | | 47,087,942.80 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 7 | **90,736,999.03** | **194,285,473.23** | 72,814,017.76 | 170,468,560.89 |
| | | | | | |
| **මුලු වත්කම්** | | | **5,581,537,853.78** | | 5,553,554,134.68 |
| **සම කොටස් හා වගකීම්** | | | | | |
| සම්මුච්චිත අතිරික්තය (ඌණතා) | | **(752,188,530.98)** | | (676,856,282.16) | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | **2,319,991,544.97** | | 2,319,991,544.97 | |
| රජයේ ප්‍රධාන | 8 | **36,138,943.05** | | 18,497,560.64 | |
| විලම්බිත ආදායම් ප්‍රධාන | 9 | **3,492,008,442.35** | **5,095,950,399.39** | 3,487,416,935.59 | 5,149,049,759.04 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික මුදල් සඳහා වෙන් කිරීම් | 10 | **373,823,908.00** | **373,823,908.00** | 283,271,227.10 | 283,271,227.10 |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු දෑ | 11 | **90,775,778.71** | | 104,650,307.67 | |
| උපචිත වියදම් | 12 | **20,987,767.68** | **111,763,546.39** | 16,582,840.87 | 121,233,148.54 |
| | | | | | |
| සමස්ථ සාධාරණත්වය වගකීම් | | | **5,581,537,853.78** | | 5,553,554,134.68 |

මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි

සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | | | |
|---|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය** | | | |
| **(වියදම් වල ස්වභාවය අනුව වර්ගීකරණය කර පෙන්නුම් කිරීම)** | | | |
| විස්තරය | සටහන | 2015 (රු.) | 2014 (රු.) |
| **මෙහෙයුම් ආදායම්** | | | |
| පුනරාවර්තන ප්‍රදාන - මහ භාණ්ඩාගාරය | | **1,162,000,000.00** | 925,246,461.44 |
| විලම්බිත ආදායම් ප්‍රදාන | | **396,423,846.71** | 405,459,678.31 |
| **අනෙකුත් ආදායම්** | | | |
| අනෙකුත් ආදායම් | 13 | **145,612,986.16** | 142,368,482.08 |
| නිෂ්පාදන ඒකක ආදායම්(ශුද්ධ) | 14 | **15,573,490.62** | 13,861,895.21 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ලද මුදල් | 15 | **118,269,864.01** | 75,691,741.77 |
| මුලු ආදායම | | **1,837,880,187.50** | 1,562,628,258.81 |
| **මෙහෙයුම්වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 16 | **1,017,313,302.11** | 730,234,595.57 |
| ගමන් වියදම් | 17 | **12,097,644.82** | 13,443,233.99 |
| සැපයුම් හා භාවිතා කරන ලද පාරිභෝජන | 18 | **23,867,354.50** | 32,383,543.52 |
| නඩත්තු වියයදම් | 19 | **32,453,285.99** | 27,760,175.04 |
| කොන්ත්‍රාත්තු සේවා | 20 | **140,531,915.07** | 135,716,461.52 |
| පුහුණු උපකරණ | | **82,089,003.86** | 76,978,188.45 |
| කාර්ය මණ්ඩල පුහුණුව | | **5,862,719.00** | 10,788,417.67 |
| ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශනය | | **20,874,593.50** | 22,289,729.35 |
| රැකියා ගත කිරීම්,පර්යේෂණ හා ව්‍යවසායකත්වය | 21 | **16,617,111.70** | 13,591,114.89 |
| ස්ථාවර වත්කම් මුදාහැරීමේ පාඩුව | | | 30,119,556.24 |
| ක්ෂය වීම් | | **396,423,846.71** | 405,459,678.31 |
| අනෙකුත් ක්‍රියාන්විත වියදම් | 22 | **46,626,598.14** | 64,443,726.47 |
| විශේෂ ව්‍යාපෘති සඳහා වියදම් | 23 | **118,269,864.01** | 75,691,741.77 |
| මූල්‍ය පිරිවැය | 24 | **185,196.91** | 184,948.02 |
| සමස්ථ මෙහෙයුම් වියදම | | **1,913,212,436.32** | 1,639,085,110.81 |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ඌණතා | | **(75,332,248.82)** | (76,456,852.00) |
| සමුච්චිත විස්තරය අතිරික්ත/ඌණතා | | | |
| පෙර වර්ෂයේ ජනවාරි 01 දිනට | | **(686,636,233.28)** | (595,665,207.92) |
| පූර්ව වර්ෂයේ ගැළපුම් | 25 | **9,779,951.12** | (4,734,222.24) |
| ජනවාරි 01 දිනට | | **(676,856,282.16)** | (600,399,430.16) |
| කාලපරිච්ඡේදයේ ශුද්ධ අතිරික්තය | | **(75,332,248.82)** | (76,456,852.00) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | **(752,188,530.98)** | (676,856,282.16) |

| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | | | |
|---|---|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | | | |
| | **2015 (රු.)** | | **2014 (රු.)** | |
| **<u>ක්‍රියාන්විත කටයුතු</u>** | | | | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌණතා) | | **(75,332,248.82)** | | (76,456,852.00) |
| පෙර වර්ෂය සඳහා ගැළපුම් | | | | |
| **<u>ගැළපුම්</u>** | | | | |
| ක්ෂය වීම් | **396,423,846.71** | | 405,459,678.31 | |
| විලම්භිත ආදායම ක්ෂය කිරීමට | **(396,423,846.71)** | | (405,459,678.31) | |
| පාඩු ලබන වත්කම් බැහැර කිරීමට | **-** | | 30,119,556.24 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | **99,630,393.20** | | 59,613,604.56 | |
| ගෙවන ලද පාරිතෝෂික | **(8,724,868.30)** | | (8,956,685.41) | |
| පූර්ව වර්ෂයේ ගැලපීම | **9,779,951.12** | | (4,734,222.24) | |
| ලැබිය යුතු දෑ වල වැඩිවීම/අඩුවීම | **(3,627,961.12)** | | 3,986,600.83 | |
| කාර්ය මණ්ඩල ණයවල වැඩිවීම/අඩුවීම | **1,724,199.14** | | (6,890,567.80) | |
| ගෙවිය යුතු දෑ වල වැඩිවීම/අඩුවීම | **(25,003,653.58)** | | 22,335,708.52 | |
| සත්‍ය වියදම් වල වැඩිවීම/අඩුවීම | **4,404,926.81** | | (8,095,129.40) | |
| තොග වැඩිවීම/අඩුවීම | **(2,237,723.09)** | **94,224,622.82** | (2,530,921.30) | 85,200,788.20 |
| ක්‍රියාන්විත කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **613,015.36** | | 8,743,936.20 |
| **<u>ආයෝජන කටයුතු</u>** | | | | |
| දේපල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | **(384,765,040.12)** | | (362,120,231.06) | |
| සිදු කෙරෙමින් පවතින වැඩ | **(16,581,729.85)** | | (83,340,649.52) | |
| වත්කම් බැහැර කිරීමෙන් ලද මුදල් | | | 7,557,805.00 | |
| ආයෝජන කටයුතු වල ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(401,346,769.97)** | | (437,903,075.58) |
| **<u>මූල්‍ය කටයුතු</u>** | | | | |
| රජයේ ප්‍රදාන මූලධන | **121,500,000.00** | | 204,500,000.00 | |
| අනෙකුත් ආදායම් ප්‍රදාන | **297,156,735.88** | | 239,373,357.30 | |
| මූල්‍ය කටයුතු වල ශුද්ධ මුදල් ප්‍රවාහය | | **418,656,735.88** | | 443,873,357.30 |
| මුදල් හා මුදල් දෑ වල වැඩිවීම/අඩුවීම | | **17,922,981.27** | | 14,714,217.92 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් දෑ | | **72,814,017.76** | | 58,099,799.84 |
| කාලපරිච්ඡේදය අවසාන මුදල් හා මුදල් දෑ | | **90,736,999.03** | | 72,814,017.76 |

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

**2015 වර්ෂයෙන් අවසන්වූ වර්ෂය සඳහා ශුද්ධ ආදායමෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

| විස්තරය | සමුච්චිත අරමුදල | රජයේ ප්‍රදාන මූලධන | විලම්භිත ආදායම් ප්‍රදාන | ප්‍රත්‍යාගණන අතිරික්තය | එකතුව |
|---|---|---|---|---|---|
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | **(595,665,207.92)** | **18,807,318.76** | **3,451,139,440.87** | **2,319,991,544.97** | **5,194,273,096.68** |
| ආරම්භක ශේෂ ගැලපීම | **(4,734,222.24)** | | **(2,445,942.39)** | | **(7,180,164.63)** |
| ප්‍රකාශිත ආරම්භක ශේෂය | **(600,399,430.16)** | **18,807,318.76** | **3,448,693,498.48** | **2,319,991,544.97** | **5,187,092,932.05** |
| වර්ෂය තුළ ප්‍රදාන | | **204,500,000.00** | | | **204,500,000.00** |
| විලම්භිත ආදායමට මාරු කරන ලද මුදල/ප්‍රදාන | | **(204,809,758.12)** | **444,183,115.42** | | **239,373,357.30** |
| වර්ෂයේදී ක්‍රමක්ෂය කිරීම | | | **(405,459,678.31)** | | **(405,459,678.31)** |
| වර්ෂය සඳහා අතිරික්ත(ඌණතා) | **(76,456,852.00)** | | | | **(76,456,852.00)** |
| 2014.12.31 දිනට ශේෂය | **(676,856,282.16)** | **18,497,560.64** | **3,487,416,935.59** | **2,319,991,544.97** | **5,149,049,759.04** |
| 2015 ජනවාරි 01දිනට ශේෂය | **(686,636,233.28)** | **18,497,560.64** | **3,486,332,412.03** | **2,319,991,544.97** | **5,138,185,284.36** |
| ආරම්භක ශේෂ ගැලපුම් | **9,779,951.12** | | **1,084,523.56** | | **10,864,474.68** |
| ගැලපුම් කරන ලද ආරම්භක ශේෂය | **(676,856,282.16)** | **18,497,560.64** | **3,487,416,935.59** | **2,319,991,544.97** | **5,149,049,759.04** |
| වර්ෂය තුළ ලද ප්‍රදාන | | **121,500,000.00** | | | **121,500,000.00** |
| විලම්බිත ආදායමට මාරු කරන ලද මුදල | | **(103,858,617.59)** | **401,015,353.47** | | **297,156,735.88** |
| වර්ෂයේ ක්‍රම ක්ෂය | | | **(396,423,846.71)** | | **(396,423,846.71)** |
| වර්ෂය සඳහා අතිරික්ත/(ඌණතා) | **(75,332,248.82)** | | | | **(75,332,248.82)** |
| 2015.12.31 දිනට ශේෂය | **(752,188,530.98)** | **36,138,943.05** | **3,492,008,442.35** | **2,319,991,544.97** | **5,095,950,399.39** |

## 1. ගිණුම් ප්‍රතිපත්ති

1.0 ආයතනික තොරතුරු

1.1 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාපිත, ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

1.2 මෙහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ අංක 354/2, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 දරණ ස්ථානයේය.

1.3 මෙම වර්ෂය තුළදී අධිකාරියෙහි ප්‍රධාන කාර්යය වූයේ ශිෂ්‍යයින්ට වෘත්තීය පුහුණුව ලබාදීමයි.

**1.4 පොදු ප්‍රතිපත්ති**

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව,මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය,ශුද්ධ වත්කම් සහ මූල්‍ය ප්‍රවාහ වාර්තාවෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සඳහා ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්(මූල්‍ය වාර්තා) පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලවය.

1.4.2 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් පිළියෙල කරනු ලබන මූල්‍ය වාර්තාව සකස් කරනු ලබන්නේ වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරුනු ලැබුවහොත් විනා උපචිත පදනමින් සහ මුල් පිරිවැය යටතේය.

1.4.3 සංසන්දනාත්මක තොරතුරු

අධිකාරිය විසින් භාවිතා කරනු ලබන ගිණුම් ප්‍රතිපත්ති අන් ආකාරයකින් ප්‍රකාශ කරනු ලැබුවහොත් විනා පූර්ව වර්ෂයේදී භාවිතා කරන ලද ඒවාට සමාන වනු ඇත. වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි පූර්ව වර්ෂයේ ඉලක්කම් සහ වැකි නැවත සකස් කර ඇත.

1.4.4 අන් ආකාරයකින් පෙන්නුම් කර නොමැත්තේ නම් විනා මූල්‍ය වාර්තාවන් ඉදිරිපත් කර ඇති වටිනාකම දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පහත පෙන්නුම් කර ඇත.

1.4.5 ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන කරුණු ගිණුම්වල ගැළපීම සිදු කළ යුතු ආකාරයේ කරුණු කිසිවක් ශේෂ පත්‍ර දිනයේ සිට සිදු වී නැත.

**1.5 බදු**

රජයේ අරමුදලින් ක්‍රියාත්මක වන අධිකාරිය ලාභ ඉපැයීමට බලාපොරොත්තු නොවන බැවින් ආදායම් බදු සඳහා විධිවිධාන සලසා නැත.

1.5.1 විලම්බිත බදු

අධිකාරියෙහි බදු ප්‍රතිපත්තිය අනුව කාලසීමාවෙහි වෙනස්කම් මත බදු වල බලපෑමක් සිදුවී නැත. එබැවින් විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන සපයා නැත.

**1.6 වත්කම් තක්සේරු කිරීම සහ එහි මිණුම් පදනම**

1.6.1 දේපල යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හඳුනා ගැනීම

පහත සඳහන් අවස්ථා වලදී දේපලක, යන්ත්‍රසූත්‍ර හා උපකරණයක පිරිවැය හඳුනා ගත යුතුය.

(අ) වත්කම් සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ගලා යා හැකිවීම.

(ආ) වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා වත්කමෙහි පිරිවැය විශ්වාසදායක අන්දමට මැනබැලිය හැකි විම. වෘත්තීය පුහුණු අධිකාරියෙහි ආරම්භක මූලධනය රු.2,000.00 කි. කෙසේ වෙතත් ස්ථාවර වත්කම් හඳුනා ගැනීම ආරම්භක මූලධනය මත පමණක් රඳා නොපවතින අතර ඒ සඳහා පහත සඳහන් කරුණුද සලකා බැලිය යුතුය.

1. බඩු වටබඩු ලේඛන වර්තමාන තත්ත්වයට ගෙන ඒමේදී උපචිත වූ වියදම් සහ කොන්දේසි FIFO පදනමින් පහත සදහන් පරිදි දක්වා ඇත.

1. පුහුණු කිරීමේ භාණ්ඩ - පිරිවැයට
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ දී මූල්‍ය අතිරික්තයක්ද අනෙකුත් වර්ෂවල ඌනතාවයක්ද ඇති වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකීමේදී 2013 වර්ෂයේදී රු. 1,023,595,450 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු. 1,338,404,900 ක් දක්වා අඛණ්ඩව වැඩිවී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

-------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයන් විසින් ආයතනයට එරෙහිව නඩු 07 ක් ද, සේවය අත්හිට වූ අධ්‍යක්ෂ (මුදල්) ට එරෙහිව ආයතනය විසින් නඩු 02 ක් ද පවරා තිබුණු අතර වර්ෂය තුල දී රු. 713,508 ක් නීති වියදම් ලෙස ගෙවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්ය සාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය පනත අනුව, වෘත්තිය පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පුහුණුවක් ලබා දීම, වෘත්තිය පුහුණුව හා ශ්‍රම වෙළඳපොල පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා සංවර්ධනය කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිය පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම, මාර්ගෝපදේශනය හා උපදේශනය, රැකියාගත කිරීම, ජාතික හා ජාත්‍යන්තර පුහුණු සංවිධාන හා ආයතන සමඟ සබඳතා පවත්වාගෙන යාම සහ වෘත්තිය පුහුණුව සඳහා අවශ්‍ය පුහුණු කරුවන් පුහුණු කිරීම, යන අරමුණු ඉටුකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රම වෙළඳපොල ඉල්ලුම හා සැපයුම පිළිබඳ පර්යේෂණ පවත්වා නොතිබුණු අතර ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම සඳහා ද අවධානය යොමුකර නොතිබුණි. තවද ශ්‍රම වෙළඳපොල අවශ්‍යතා පවතින ක්ෂේත්‍ර අනුව හඳුනාගත් පාඨමාලා සඳහා ආධුනිකයින් ආකර්ෂණය කර ගැනීමට හා පුහුණු කිරීම සඳහා සුදුසු වැඩසටහන් අධිකාරිය විසින් ක්‍රියාත්මක කර නොතිබූ අතර එම පාඨමාලා සඳහා ආධුනික සහභාගීත්වය පහල මට්ටමක පැවතුණි.

(ii) ශීතකරණ හා වායු සමීකරණ අළුත්වැඩියා, මැණික් හා ස්වර්ණාභරණ, ආහාර තාක්ෂණ, සම්භාණ්ඩ හා පාවහන්, ධීවර හා විසිතුරු මත්ස්‍ය සහ මුද්‍රණ යන වෘත්තිය ක්ෂේත්‍රවල සමාලෝචිත වර්ෂයේදී පුහුණු කර තිබූ ආධුනික සංඛ්‍යාව සමස්ත සංඛ්‍යාවෙන් සියයට 5 ට වඩා අඩුවිය.

(ආ) පසුගිය වර්ෂ 3 ක පාඨමාලා පැවැත්වීම සහ වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පිළිවෙලින් ආධුනිකයින් 28446 ක්, 28692 හා 28745 ක් පුහුණුව සඳහා බඳවාගෙන තිබූ අතර ඒ අනුව ආධුනික සංඛ්‍යාවේ වැඩිවීම සියයට එකටත් වඩා අඩු බව නිරීක්ෂණය විය. පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව 1925 ක්, 1939 ක් හා 1952 ක් වූ නිසා එම වර්ෂවලදී පාඨමාලා සංඛ්‍යාවේ වැඩි වීමද සියයට එකකට වඩා අඩු බව නිරීක්ෂණය විය.

(ii) වෘත්තීය සුදුසුකම් මට්ටම් (එන් වී කිවු) සඳහා ප්‍රතිතනය කර නොතිබූ පාඨමාලා සංඛ්‍යාව 2013 දී 522 සිට 2015 දී 198 දක්වා අඩුකර ගෙන තිබූ අතර වෘත්තීය කුසලතා 4 මට්ටමේ පාඨමාලා 2013 දී 383 සිට 775 දක්වා වැඩි කර තිබීම යහපත් ප්‍රවණතාවක් විය.

(iii) 2015 වර්ෂය සඳහා පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා 2405 ක් පැවැත්වීමට ඉලක්ක කළද පාඨමාලා 1952 ක් පමණක් පවත්වා තිබූ අතර ඒ අනුව පාඨමාලා 453 ක් පවත්වා නොතිබුණි.

(iv) ආධුනික සංඛ්‍යාව 5 සහ ඊට අඩුවෙන් බඳවාගෙන තිබූ පාඨමාලා සංඛ්‍යාව 28 ක් විය.

(ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වූ ක්‍රියාකාරකම් වල කාර්ය සාධනය.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුහුණු මධ්‍යස්ථාන 60 ක ව්‍යාපාර ඒකක (business unit) 60 ක් ආරම්භ කිරීමට ඉලක්ක කර තිබුණද මධ්‍යස්ථාන 07 ක පමණක් කටයුතු ආරම්භ කර තිබුණි.

(ii) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2015 දෙසැම්බර් 31 වන විට බඳවා ගත යුතු වූ කාර්ය මණ්ඩලය 167 ක් වූ නමුත් නිලධාරීන් 43 ක් පමණක් බඳවාගෙන තිබීම හේතුවෙන් සපුරා නොගත් ඉලක්කය සියයට 75 ක් විය. බඳවා ගන්නා ලද උපදේශකවරු 25 දෙනෙකු අතරින් 11 දෙනෙකු ආයතනයෙන් ඉවත්ව ගොස් තිබූ අතර තවත් උපදේශකයින් 7 දෙනෙකු ඉලක්ක කරගෙන මධ්‍යස්ථානවල පාඨමාලා ආරම්භ කර තිබුණ ද සේවා නියුක්ත කර නොතිබුණි.

(iii) ව්‍යාපෘති සැලසුම යටතේ වූ බඳවා ගැනීම් වලට අමතරව 2015 වර්ෂයේ අධිකාරිය විසින් බඳවා ගන්නා ලද උපදේශක නිලධාරීන් 43 දෙනෙකු සඳහා අය-වැය ප්‍රතිපාදන සලසා ගෙන නොතිබීම නිසා 2015 වර්ෂය තුළ එම නිලධාරීන්ගේ වැටුප් සඳහා රු. 13,147,737 ක් ව්‍යාපෘතිය මගින් ගෙවීම් කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය මගින් තෝරාගත් මධ්‍යස්ථාන 07 ක නව පාඨමාලා 40 ක් ආරම්භ කිරීමටත් එම පාඨමාලා සඳහා අවශ්‍ය සියළුම උපකරණ සැපයීමටත් ඉලක්ක කර තිබුණද 2015 දෙසැම්බර් 31 දක්වා මෙයින් පාඨමාලා 26 ක් ආරම්භ කර නොතිබුණි.

(v) අධිකාරියේ පවතින කළමනාකරණ තොරතුරු පද්ධතිය සමාලෝචනය හා සංවර්ධනය කර ආධුනික ලියාපදිංචිය, මූල්‍ය, ගබඩා, පරිපාලන හා පුස්තකාල කටයුතු විධිමත් කිරීම ආවරණය වන පරිදි පරිගණක ජාලයක් ස්ථාපිත කිරීම අරමුණු කලද එබඳු තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ආරම්භ කර නොතිබුණි.

(vi) ව්‍යාපෘති අරමුණක් වූ විදේශීය සේවා නියුක්තිය ඉලක්ක කරගත් නව පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම සඳහා අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(vii) ව්‍යාපෘති සැලසුම් අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ නව පුහුණු මධ්‍යස්ථාන 10 ක් ඉදි කර අවසන් කළ යුතු වුවත් එක් මධ්‍යස්ථානයක පමණක් ඉදිකිරීම් ආරම්භ කර තිබූ අතර වැඩි දියුණු කළ යුතු මධ්‍යස්ථාන 50 න් මධ්‍යස්ථාන 12 ක් පමණක් වැඩි දියුණු කර තිබුණි.

(viii) නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි කොළඹ පිහිටි ජාතික මධ්‍යස්ථානයක සම්පූර්ණ මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී පාඨමාලාවේ 2012 සහ 2014 වර්ෂවල කණ්ඩායම්වල ආධුනිකයන්ගේ සහතික පත් 2016 ඔක්තෝබර් 26 දින තෙක් ලබා දී නොතිබුණි.

(ඇ) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 15 (1) වගන්තිය මගින් වෘත්තීය පුහුණු සහා පිහිටුවීම පිළිබඳ සඳහන් කර ඇති අතර ඒ අනුව 1996 අප්‍රේල් 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ වෘත්තීය පුහුණු සහා පිහිටුවීමට අදාල වූ නියෝග නිකුත්කර තිබුණද 2015 දෙසැම්බර් 31 තෙක් එබඳු සහා පිහිටුවා නොතිබුණි. තවද පාඨමාලා ආරම්භ කිරීම හා නතර කිරීම විධිමත් පදනමකින් තොරව සිදු කරන බව නිරීක්ෂණය විය.

(ඉ) 2013 හා 2014 වර්ෂවල ක්‍රියාකාරී වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිවෙලින් 275 ක් හා 251 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට එම සංඛ්‍යාව 247 ක් දක්වා අඩු වී තිබුණි.

(ඊ) පුත්තලම දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ කාර්මික ශිල්පී පාඨමාලාව ආරම්භ කිරීමට අවශ්‍ය උපකරණ කොටසක් පමණක් ලබාදීම හේතුවෙන් නියමිත පාඨමාලාව ආරම්භ කර නොතිබුණි.

(ඊ) අහංගම ප්‍රදේශයේ නව හෝටල් පාසලක් ඉදිකිරීමට යෝජනා කර එහි පැවැත්වීමට නියමිත පාඨමාලා 03 ක් සඳහා අවශ්‍ය රු. 8,605,519 ක් වූ පුහුණු උපකරණ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2015 සිට මිලදී ගෙන තිබුණ ද හෝටල් පාසලේ ඉදිකිරීම 2016 මැයි දක්වාම ආරම්භකර නොතිබූ අතර උපකරණ 2015 වර්ෂයේ සිට ආසන්න මධ්‍යස්ථානවල ගබඩා කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අධිකාරියේ වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ඇති ඉඩම් 248 ක් වූ අතර එයින් රාජ්‍ය අංශය සතු ඉඩම් 178 ක් හා පෞද්ගලික අංශය සතු ඉඩම් 70 ක් ද විය. 2015 දෙසැම්බර් 31 වන විට රජයේ ඉඩම් 32 ක පමණක් අයිතිය අධිකාරිය වෙත විධිමත්ව පවරාගෙන තිබූ අතර ඉඩම් 60 ක අයිතිය පවරා ගැනීමට සැලසුම් කර තිබූ නමුත් ඉතිරි ඉඩම් 86 පවරා ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. පෞද්ගලික අංශය සතු ඉඩම් වලින් ඉඩම් 35 ක් සඳහා පමණක් දෙපාර්ශවය අතර ගිවිසුම් අත්සන්කර තිබුණි.

(ආ) 2006 ජනවාරි සිට 2015 මැයි මාසය දක්වා අධිකාරියේ නිලධාරීන් වෙත ගෙවන ලද ජීවන වියදම් දීමනාව සහ අය වැය දීමනාවට අදාල සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායක මුදල් රු. 207,752,019 ක් අධිකාරිය විසින් අදාල අරමුදල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) පාඨමාලා සඳහා උපදේශකවරයකු නොමැතිව, වෘත්තිය සුදුසුකම් මට්ටම සඳහා ප්‍රතිතනයට අවශ්‍ය උපකරණ, පන්ති කාමර පහසුකම් ආදිය සම්පූර්ණ කිරීමකින් තොරව රත්මලාන ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ වායු පීඩන කාර්මික ශිල්පී පාඨමාලාවක් ආරම්භ කර තිබුණි.

(ඇ) අනුරාධපුර දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් රථ විදුලි කාර්මික පාඨමාලාවට පුහුණු කටයුතු සඳහා 2012 මාර්තු 30 දින ලබාදී තිබූ රු. 1,639,729 ක් වටිනා නව මෝටර් රථ පෙට්‍රල් එන්ජින් 02 ක් 2015 දෙසැම්බර් 31 වනවිට ක්‍රියා විරහිත තත්ත්වයේ පැවතුණු නමුත් ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

මූල්‍ය අක්‍රමිකතා මත වැඩ තහනම් කර නඩු පවරා තිබූ අධ්‍යක්ෂවරයෙකුට අනුමැතියකින් තොරව වැටුප් වශයෙන් රු. 1,711,961 ක් ගෙවා තිබූ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.4 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 266,968 ක් වූ ලංකා අශෝක් ලේලන්ඩ් බස්රථය වර්ෂ දෙකකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) රත්මලාන ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පැස්සුම් ශිල්පී පාඨමාලාවට අයත් නොවූ විශාල ප්‍රමාණයේ තහඩු නවන බෙන්ඩින් යන්ත්‍රය හා තහඩු රෝල් කරන රෝලින් යන්ත්‍රය පැස්සුම් ශිල්පී පාඨමාලා පරිශ්‍රය තුල දිගු කලක් නිෂ්කාර්යව පැවැතුණි.

(ඇ) අනුරාධපුර දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන භෝජනාගාර සේවක පාඨමාලාවට අවශ්‍ය උපකරණ තිබියදී ඒ පිළිබඳ නොසලකා රු. 4,862,672 ක් වටිනා උපකරණ 2015 මැයි 06 දින නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නවීකරණ කටයුතු සඳහා වසා දමා ඇති මධ්‍යස්ථාන දෙකකට සහ තවත් මධ්‍යස්ථාන දෙකකට අයත් අක්‍රිය බැංකු ගිණුම් 05 ක රු. 201,737 ක් වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රියව පැවැතුණි.

(අ) නවීකරණ කටයුතු සඳහා වසා දමා ඇති මධ්‍යස්ථාන දෙකකට සහ තවත් මධ්‍යස්ථාන දෙකකට අයත් අක්‍රීය බැංකු ගිණුම් 05 ක රු. 201,737 ක් වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ආ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව 2011 වර්ෂයේදී පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදුන් රු. 9,815,345 ක් අදාල කාර්යයන් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් අධිකාරියේ සම්පත්**

---

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වෙත එක් නිලධාරියෙක් හා විධිමත් අනුමැතියක් රහිතව වාහන දෙකක් ලබා දී තිබූ අතර නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය වෙත නිලධාරීන් දෙදෙනෙක් නිදහස් කර තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අධ්‍යක්ෂ (මුදල්) තනතුර 2015 අප්‍රේල් 30 දින සිට පුරප්පාඩුව පැවති අතර 2015 මැයි 05 දින සිට මෙම තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක පත්කර තිබුණි. එහෙත් අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු 2017 පෙබරවාරි 28 දින වනවිටත් පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරී ඉටුකිරීමට උක්ත නිලධාරියාගේ යටත් විගණන නිලධාරිවරයෙකු පත්කර තිබූ බැවින් මූල්‍ය අංශයේ ගනුදෙනු ස්වාධීන අභ්‍යන්තර විගණනයකට යටත් නොවීමට ඉඩ ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 2438 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1894 ක් වූයෙන් පුරප්පාඩු 544 ක් වී තිබුණි. පුරප්පාඩු වලින් 260 ක් උපදේශකවරුන් වීම නිසා ඉලක්ක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ඇ) අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියේ 5.1.1 වගන්තිය අනුව උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේ දී ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමක් යටතට ගන්නාවූ තාක්ෂණ විද්‍යා පාඨමාලාවක් හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු වුවත් 2014 වර්ෂයේ දී බඳවාගත් උපදේශකවරුන් පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවේදී පරීක්ෂා කරන ලද ලිපිගොනු 91 න් 23 දෙනෙකුම එම සුදුසුකම සපුරා නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) අධිකාරියේ බඳවා ගැනීම් පරිපාටිය අනුව අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර සඳහා බඳවා ගැනීමේදී බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2.6 වගන්තිය ප්‍රකාරව නියමිත නිළයන්ගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් නියම කර ඇති ලකුණු දීමේ ක්‍රමවේදයට අනුව සිදුකල යුතු වුවද එයට පටහැනිව 2015 ජුනි 05 දිනැති අධිකාරියේ සභාපතිවරයාගේ නිර්දේශය සමඟ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් 8 දෙනෙකුගේ අත්සන් සහිත ලිපියකට අනුව එම තනතුර සඳහා 2015 අප්‍රේල් 22 දින සිට නිලධාරියෙකු අවිධිමත්ව පත්කර තිබුණි.

(ඉ) උපදේශකවරුන්ගේ අතිරික්තයක් පවතින කොළඹ පිහිටි ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක සේවා කාලය වර්ෂ 10 සිට 16 දක්වා වූ උපදේශකවරු 6 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. පාඨමාලා පවත්වාගෙන යන අතරමඟදී උපදේශකවරු මාරු කිරීම නිසා පාඨමාලා හදාරන ආධුනිකයන්ට ගැටළු ඇති වූ අවස්ථා රත්මලාන හා අනුරාධපුර දිස්ත්‍රික් මධ්‍යස්ථාන විගණනයේදී අනාවරණය විය.

(ඊ) මාධ්‍ය සම්බන්ධ පුහුණු වැඩසටහන් අධිකාරිය විසින් නොපැවත්වුවද 2011 වර්ෂයේදී එම ක්ෂේත්‍රය සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ නොකල උපදේශකවරියක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. උපදේශක තනතුරට අදාල කාර්යභාරයන් ඇය විසින් ඉටුකර නොතිබියදී දිගින් දිගටම සේවා දීර්ඝ කිරීම් ලබා දී තිබූ අතරම 2014 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ උපදේශකවරියක ලෙස ක්ෂේත්‍රය මාරු කර තිබුණි. එම ක්ෂේත්‍රයේද කාර්යභාරයන් විධිමත්ව ඉටුකර නොතිබූ අතර 2016 වර්ෂයේ සිට අනුමත වැඩ පිළිවෙලක් නොතිබියදී සතියේ දින 03 ක් කොන්ත්‍රාත් පදනම මත සේවය කරන මෙම නිලධාරිනිය මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා නිදහස් කිරීමට ඉහල කළමනාකරණය කටයුතු කර තිබුණි.

**4.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

ප්‍රතිසංස්කරණය සඳහා යෝජිත ඇහැලියගොඩ, මාපාකඩ වැව, බිංගිරිය, බද්දේගම සහ වැල්ලවාය යන මධ්‍යස්ථාන 05 හි ඉදිකිරීම් සම්බන්ධ උපදේශක සේවා සැපයීම වෙනුවෙන් 2014 වර්ෂය තුලදී රු. 2,130,290 ක් වැය කර තිබුණද 2016 මාර්තු 31 දින තෙක් එම ඉදිකිරීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009(i) හා මුදල් රෙගුලාසි 133 හි සඳහන් පරිදි විගණන වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුව තිබුණත් සමාලෝචිත වර්ෂයේ ආයතනය සතුව නිළධාරීන් 12 දෙනෙකුගෙන් සැදුම්ලත් අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකව පැවතියද විගණන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කටයුතු වල පැවති අඩුපාඩු හේතුවෙන් එම ඒකකය පවත්වාගෙන යාමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජුනි 10 දින අනතුරකට භාජනය වී තිබුණු වාහනයක් සම්බන්ධයෙන් 2014 ජුලි 30 දින දක්වා මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා නොතිබුණි. රියදුරුට විරුද්ධව උසාවියේ නඩු පවරා තිබුණු අතර වරද පිළිගෙන දඩ මුදල් ගෙවීම, අනතුරේදී තෙවන පාර්ශවයට සිදුවූ රු. 255,950 ක අලාභය ගෙවන ලෙස 2012 මැයි 04 දින එන්තරවාසියක් එවා තිබුණද ඒ සම්බන්ධයෙන් 2015 ජුලි 31 දින දක්වාම කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) භාවිතයෙන් ඉවත් කරන ලද ජංගම නොවන වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය එම වත්කම් භාවිතයෙන් ඉවත් කරන අවස්ථාවේ දී වත්කම් ඉවත් කිරීමේ ගිණුමක් මහින් ගිණුම්වලින් ඉවත් කර ලාභය හෝ පාඩුව, අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු වුවත්, 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම ඉවත් කරන ලද කිසිදු වත්කමක අගය වත්කම් ගිණුමෙන් හා සමුච්චිත ක්ෂය ගිණුමෙන් ඉවත් කර

(ඈ) 2006 ජනවාරි 17 දින සිට අධිකාරියේ සභාපතිවරයා විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලන මණ්ඩලයේ සාමාජික හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටුකිරීම සඳහා සතියකට වරු 3 ක් සහ පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වෙන දිනවල ඒවාට සහභාගීවීම සඳහා වැටුප් සහිතව නිදහස් කර තිබුණි. 2014 වර්ෂය දක්වාම එම නිලධාරියා මෙම ආයතන දෙකෙහිම සේවයේ යෙදී තිබුණි. අධිකාරියෙන් වැටුප් ලබන අතරම මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් දීමනා ලෙස රු. 5,444,015 ක් ලබාගෙන තිබුණි.

2014 සැප්තැම්බර් 12 දින පැවැති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිළිබඳ පොදු ව්‍යාපාර කාරක සභා අවස්ථාවේදී ආධිකාරියෙන් වැටුප් ලබා ගැනීමට අමතරව වෙනත් අයතනයකින් වැටුප් ලබා ගැනීම පිලිබඳව ජනාධිපති ලේකම් විමසා උපදෙස් ලබා ගන්නා ලෙස ලේකම්වරයාට නියෝග කර තිබූ නමුත් ඒ සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව සුදුසුකම් හෝ පලපුරුද්ද සම්පූර්ණ කර නොතිබියදී අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන), අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන රැකියා ස්ථාපන හා ප්‍රවර්ධන), නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු හා නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩලය තුල නොවූ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා නිලධාරියකු බඳවාගෙන තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | - බඳවා ගැනීමේ අවම සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බඳවා ගැනීම. |
| | | - සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල විධිමත්ව ක්‍රියාත්මක නොවීම. |
| | | - විධිමත් ස්ථානමාරු ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | - විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් නොපැවැත්වීම. |
| | | - වත්කම් හඳුනා ගැනීමේ කේත භාවිතා නොකිරීම. |
| | | - නිෂ්කාර්ය වත්කම් පැවතීම. |
| | | - සියළු වත්කම් ඉන්වෙන්ට්‍රිගතව පැවතීම තහවුරු නොවීම හා වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම. |
| (ඇ) | <u>ආදායම් පාලනය</u> | |
| | i. ආධුනික දීමනා | - ආධුනික දීමනාව ලැබුණු බවට ආධුනිකයාගෙන් තහවුරුවක් ලබා නොගැනීම. |
| | | - දීමනාව ගණනය කිරීමේ ක්‍රමවේදයේ වෙනස්කම් තිබීම. |
| | ii. පාඨමාලා ගාස්තු | - පාඨමාලා ගාස්තු බැංකුගත නොකර, උපදේශකවරු විසින් මුදලින් ලබා ගැනීම. |
| | | - සියළු අර්ධකාලීන පාඨමාලා සඳහා රාජ්‍ය භාගය අයකරන බව තහවුරු කරගෙන නොතිබීම, හා වෙනම ආදායමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබීම. |

(ඈ) මුල්‍ය පාලනය

- කාර්යභාරයන් බෙදීම හා ඒවා අභ්‍යන්තර පරීක්ෂා වන පරිදි ක්‍රියාත්මක නොවීම.
- අධීක්ෂණ කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම.
- වියදම්වල බැංකුවෙන් ගෙවන ලද වටිනාකම් සහ ලෙජරයේ සඳහන් වටිනාකම් අතර වෙනස්කම් පැවතීම.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව විගණන වාර්තාවේ නිරීක්ෂණ වාර්තාව**

2.2.1(අ) ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් පැනනැගී නැත.

2.2.1(ආ) 2017 වර්ෂයේ කටයුතු සිදුකරමින් පවතී.

2.2.2 මේ වන විට සකස් කර ඇත.

2.3(අ) අයවිය යුතු ශේෂයන්ගෙන් 6,966,641 මුදලින් මිලියන 1,453,670.75 වටිනාකම් කපා හැරීමට කටයුතු කර ඇත. ඉතිරි ශේෂ ලියා හැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතියට ඉදිරිපත් කර ඇත.

2.3(ආ) ණයහිමියන් වෙත දැනුම් දී ඇත.

2.4(අ) ඒ අනුව නිවැරදි කර ඇත.

2.4(ආ) i මේ සඳහා මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණයක් සිදු කර ඇත. එහි නිර්දේශ ලැබුණු පසු ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත.

2.4(ආ) ii අදාල තොරතුරු ලද විගස අදාල ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.4(ආ) iii ඒ අනුව ඉදිරියේදී නිවැරදි වනු ඇත.

2.4(ඇ)

| නම | වැඩ බලන තනතුර | හේතුව |
|---|---|---|
| P.රාමදාස් මහතා | මූල්‍ය නිලධාරී | මුලතිව් දිස්ත්‍රික්කයට පත් කළ මූල්‍ය (මූල්‍ය නිලධාරී-වව්නියාව) නිලධාරී රාජකාරී භාරනොගත් නිසා වැඩ බැලීමට පත් කරන ලදී.<br>සේවා අවශ්‍යතාවය අනුව සභාපතිතුමාගේ අනුමැතිය මත මේ දක්වා වැඩ බැලීම සිදු කරයි. |
| H.M.L.A.සමරනායක මහතා | ප්‍රවාහන නිලධාරී | මෙම තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා දී ඇත්තේ අභ්‍යන්තර පුරප්පාඩු පිරවීමක් වශයෙනි. මෙම තනතුරේ මූලික සුදුසුකම්වනුයේ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ NVQ 5 සුදුසුකම ලබා තිබීමයි. එහෙත් දැනට ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් අභ්‍යන්තරව නොසිටින බැවින් පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. |
| H.U.කාරියවසම් මහතා | අධ්‍යක්ෂ (මුදල්) | 2018 වර්ෂයේ දී මෙම තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කිරීමට සැළසුම් කර ඇත. |

2.5(අ) අර්ධකාලීන පාඨමාලා සඳහා ඇස්තමේනතු විධිමත් අයුරින් ඉදිරිපත් කර පුහුණු අංශයේ අනුමැතිය ලබාගැනීමෙන් පසු අනුමත කරන ලද ඇස්තමේන්තුවට අනුව පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික් හා ජාතික වෘත්තීය පුහුණු ආයතන භාර නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී ඇත.

2.5(ආ) වර්තමාන තත්වයද එසේම පවතී.

2.5(ඇ) මෙතෙක් භාණ්ඩාගාර අනුමැතිය ලැබී නැත. 2017 වසරේ මෙය ක්‍රියාත්මක නොවේ.

3.1 ආධුනිකයින් බඳවා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ලෙස වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් දිස්ත්‍රික් මධ්‍යස්ථාන හා ජාතික මධ්‍යස්ථාන ලෙස වෙන වෙනම ක්‍රමවත්ව පැවැත්වීම මත මෙම වියදම් වැඩි වී ඇත.

රැකියාගත කිරීම්, පර්යේෂණ හා ව්‍යවසායකත්ව වියදම් අඩුවීමට හේතුව වියදම් කළමණාකරණ පද්ධතියේ ඇති විධිමත්භාවයයි. එසේම වසරේ සිදු කරන ලද පර්යේෂණ මෙහෙයුම් කටයුතු වල වැඩිවීමක් සිදු වුවද එහි පිරිවැය කළමණාකරනය වන අයුරින් කටයුතු සිදු වී ඇත.

එසේම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා වේතන වැඩිවීමත් ඒ අනුව ගෙවන අතිකාල හා අනියම් ගමන් වියදම් වැඩි වීමත් සිදුවී ඇත. පුහුණු ද්‍රව්‍ය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුල කටයුතු සිදු කලද පුහුණු ද්‍රව්‍ය වල මිල ගණන් ඉහල යාම මත ඒ සඳහා වැය වූ පිරිවැය ඉහල ගොස් ඇත.

3.2

| අනු අංකය | නඩු අංකය | නඩු පවරා ඇති ආයතනය / සේවකයා | 2016 වසරේ දී දරණ ලද වියදම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2/අති/3668/2013 | එස්.ඒ.ඩී.ජේ. චන්ද්‍රකුමාර මහතා (අධ්‍යක්ෂ මුදල්) | නිතිඥ ගාස්තු - රු.154,500 /= රජයේ සාක්ෂිකරුවෙකු සඳහා බටා ගාස්තු - රු.3000.00 | ලිඛිත දේශන ගොනු කිරීමට නියමිතය. 2018.02.02 |
| 2. | DMR 1029/2014 (ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවරා ඇත) | එස්.ඒ.ඩී.ජේ. චන්ද්‍රකුමාර මහතා (අධ්‍යක්ෂ මුදල්) | රු. 27,750/= | විභාගයට නියමිතයි. 2018.09.26 |
| 3. | SCFR - 161/2014 | මංගලා කුමාරි සියමුදලි සහ තවත් සිව්දෙනෙකු විසින් පවරා ඇති නඩුව. | ගෙවීමේ ඉන්වොයිසි පත්‍ර මෙතෙක් ලැබී නොමැත. | විභාගයට නියමිතයි. 2018.03.14 |
| 4. | SCFR – 309/2014 | ඩී.එම්. යහම්පත් සහ තවත් සිව්දෙනෙකු විසින් පවරා ඇති නඩුව. | ගෙවීමේ ඉන්වොයිසි පත්‍ර මෙතෙක් ලැබී නොමැත. | විභාගයට නියමිතයි. 2018.01.23 |

ඒ අනුව 2016.12.30 දින වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පැවතියේ නඩු 04ක් පමණි.2016 වසරේ අධිකාරිය නඩු සඳහා නීතිඥ ගාස්තු වශයෙන් රු.182,250.00 මුදලක් ගෙවීම් සිදුකර ඇත.මූල්‍ය අක්‍රමිකතාවන්ට එරෙහිව වැඩතහනම් කළ නිළධාරියාට ගෙවන ලද වැටුප් අය කරගැනීම සඳහා DMR 1029/2014 දරණ මුදල් අය කර ගැනීමෙ ( Money Recovery Matter) නඩුව කොළඹ දිසා අධිකරණයේ පවරා ඇති අතර මේ වන විට එය විභාගය සඳහා නියමිතව ඇත.තව ද මේ සම්බන්ධව දැනට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මඟින් ද පරීක්ෂණ සිදු කරමින් පවතී

4.1(අ) * තෝරාගත් පුද්ගලික අංශයේ ප්‍රවීණතම ආයතන 07 සමඟ ඒකාබද්ධව වර්ෂයකට 4000 වඩා වැඩි වෘත්තිකයින් පිරිසක් පුහුණු කිරීම් කටයුතු දීපව්‍යාප්තව සිදු කිරීම.

* දින 08 ක ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන සති අන්ත ව්‍යවසායකත්ව පුහුණුව වැඩසටහන ලෙස පුහුණුලාභීන් දැනුවත් කිරීම හා පුහුණුකිරීම තුලින් SEPI ණය නිකුත් කිරීම් ප්‍රමාණය විශාල ප්‍රගතියක් ලඟාකරගෙන ඇත.

* දැනට විදුලි කාර්මික හා ශීතකරණ හා වායු සමීකරණ පාඨමාලා සඳහා Gap Filling වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඉදිරියේදී එය වාර්තා වේ. විදේශීය රැකියා ආයතන විශාල ප්‍රමාණයක් ලියාපදිංචි කර ඇත.

* රූපලාවන්‍ය, තොරතුරු තාක්ෂණය හා හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව අවශ්‍ය වැඩමුළු ක්‍රියාත්මක වෙමින් පවතී.

* MIS පද්ධතිය හරහා අවශ්‍ය තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම් කටයුතු සිදු කරමින් පවතී.

* වාර්ෂික මුදල් ප්‍රතිපාදන වෙන්වීම් ප්‍රමාණය මත දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් දැනට මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වේ.

* එක් එක් නිලධාරීන් සඳහා තනි තනි වශයෙන් වාර්ෂික, මාසික ඉලක්කයන් ලබාදී වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සාර්ථකව සිදුකර ඇත. උතුරු නැගෙනහිර ප්‍රදේශ වල ඒ සඳහා දෙමළ මාධ්‍යයෙන් නිලධාරීන් අලුතින් බඳවා ගැනීම සිදුකර ඇත.

* සෑම වර්ෂයකම රූපවාහිනී, ගුවන්විදුලි, පුවත් පත්, රජයේ ගැසට් පත්‍රය මගින් මෙන්ම අත්පත්‍රිකා පෝස්ටර් බැනර් මගින් පුළුල් ප්‍රචාරණයක් ජනතාව දැනුවත් කිරීමට සිදු කර ඇත.

* දුම්රිය ස්ථාන වල දැන්වීම් හා බස් රථ ආකර්ෂණීය ලෙස ස්ටිකර් කර ප්‍රචාරණ කටයුතු වර්ධන වැඩසටහන් සාර්ථකව නිම කර ඇත.

* එක් එක් නිලධාරීන් මධ්‍යස්ථාන මට්ටමින් පාඨමාලා මට්ටමින් උපදේශණ අත්පොතෙහි වැඩසටහන් ක්‍රියාත්මක කර ප්‍රගතිය වාර්තාගත කිරීම ඉහල මට්ටමකින් සිදු වේ.

* උපදේශක රැකියා තෘප්තිය දහ ආධුනික ආධුනිකාවන්ගේ ආකර්ශනය වැඩිවන අයුරින් කටයුතු කර ආධුනික සහභාගීත්වය ඉහළ නංවා ඇත. එමෙන්ම 2017 වසරේ සිට සියළුම පාඨමාලා නොමිලයේ පවත්වන බැවින් මෙම ක්ෂේත්‍රයන්ගේද ආධුනික ආකර්ෂණය ඉහල අගයක් ගනු ඇත.

4.1(ආ)i. 2016 වසරෙහි දී පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව 1961 වන අතර බඳවාගත් ආධුනික සංඛ්‍යාව 31628කි.

4.1(ආ)ii. 2016 වසරෙහි ප්‍රතිනනය කර නොතිබූ පාඨමාපා සංඛ්‍යාව 111 වන අතර NVQ 4 පාඨමාපා සංඛ්‍යාව 521 කි.

4.1(ආ)iii. 2016 වසරේ පවත්වන ලද පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා සංඛ්‍යාව 1363 වන අතර වැඩසටහන් සංඛ්‍යාව 2073 කි.

4.1(ආ)iv. 2016 වසරෙහි ආධුනිකයන් 5 ට අඩු පාඨමාලා සංඛ්‍යාව 10 කි.

4.1(ඇ)i 2014/2015 – 10, 2016 – 11, 2017 – 10, වශයෙන් ව්‍යාපාර සැලසුම් ක්‍රියාත්මක මධ්‍යස්ථාන (Business Plan Implementing Centers) 31 ක් මේ වන විට ස්ථාපිත කර ඇත.

4.1(ඇ)iv. 2017 වසර වන විට හඳුනාගත් මධ්‍යස්ථාන 11 ක පාඨමාලාවන් 34 ක් පවත්වාගෙන යනු ලබයි.

4.1(ඇ)vi. විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ විදේශ රැකියා නියෝජිත ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් විදේශ රැකියා අපේක්ෂිත 31 දෙනෙකු සඳහා ශීතකරණ සහ වායු සමීකරණ ක්ෂේත්‍රෙය් විශේෂ පුහුණු වැඩසටහනක් 2016 වසරේ පවත්වන ලදී.

4.1(ඇ) මෙම ඡේදයේ සඳහන් පරිදි වෘත්තීය පුහුණු අධිකාරි පනතට අනුව වෘත්තීය පුහුණු සභා ආරම්භ කල යුතුව තිබුණි. ඒ අනුව වෘත්තීය පුහුණු අධිකාරිය ආරම්භයේ පුහුණු සභා ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත. නමුත් සමාජිකයන් රැස් කර ගැනීමේ අපහසුතාවය ඇතුළු නොයෙකුත් හේතූන් නිසා එය පසුකාලීනව ක්‍රියාත්මක නොවීය. කෙසේ නමුත් මෙහි ඵලදායීතාවය සොයා බලා ඇමතිතුමන් දැනුවත් කොට ඉදිරියේදී මෙම පුහුණු සභා ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

තවද පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, පාඨමාලා සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීම, වැඩිදුර පුහුණුවේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම, විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම ආදී අරමුණු මුල් කොට ගෙන පුහුණු ක්ෂේත්‍ර කිහිපයක් සඳහා අප ආයතනය විසින් ප්‍රමුඛපෙළේ පෞද්ගලික අංශයේ ආයතන වල ප්‍රවීණයන්ගෙන් සමන්විත උපදේශන කමිටු පිහිටුවා ඇති අතර ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (SSDP) මඟින්ද ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා 2016 ජනවාරි සිට ක්ෂේත්‍රයේ නිපුණයන්ගෙන් පුහුණු ක්ෂේත්‍ර කිහිපයකට සඳහා Sector council පිහිටුවා වෘත්තීය පුහුණුවේ

ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා කටයුතු කරනු ලබයි. මෙමඟින් පුහුණු සභාවල ජාතික මට්ටමේ අරමුණු ඉටුවනු ඇත.

4.1(ඉ) 2016 වසරේ පුහුණු මධ්‍යස්ථාන 232 සහ අනුයුක්ත මධ්‍යස්ථාන 35 කින් සමන්විත මධ්‍යස්ථාන 267 ක පුහුණු කටයුතු සිදු කරනු ලබයි.

4.1(ඊ) * මේ වන විට මධ්‍යස්ථානයෙහි එක් අවුරුදු යන්ත්‍ර ශිල්පී පාඨමාලාව ආධුනිකයන් 14 දෙනෙකු බඳවාගෙන සාර්ථකව පවත්වාගෙන යනු ලබයි.

* අහංගම හොටල් පාසල නවීකරණ ව්‍යාපෘතිය හා කුච්චවේලි හෝටල් පාසල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2016 වසර අවසාන වන විට අවසාන කර නොතිබුණද , කුච්චවේලි හෝටල් පාසල ඉදිකිරීම මේ වන විට අවසාන කර ඇති අතර , අහංගම හෝටල් පාසල නවීකරණයද මේ වසර තුළ අවසාන කිරීමට නියමිතය.

4.2(අ) • පවරා ගැනීමට ඉල්ලීම් කර ඇති ඉඩම් අතුරින් ඉඩම් 18 ක පමණ මේ වන විට මැනුම් කටයුතු සිදුකර ඇත. පවරා ගැනීමට අදාල ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

• එසේම ගිවිසුම් අත්සන් කර නොමැති මධ්‍යස්ථාන 35 සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී.

4.2(ආ) මේ වන විට වාරික දෙකකින් රු. 67,674,000 මුදලක් අරමුදලට ගෙවා ඇත

4.2(ඇ) මේ වන විට මෙම පාඨමාලාව සඳහා ආධුනිකයන් 14 ක් බඳවාගෙන පුහුණු කටයුතු සිදු කරනු ලබයි.

4.2(ඈ) මේ වන විට මෙම උපකරණ පුහුණු කටයුතු සඳහා යොදා ගනු ලබන අතර අලුත් වැඩියාවන්ද සිදු කරමින් පවතී.

4.3 මූල්‍ය අක්‍රමිකතාවන්ට එරෙහිව වැඩ තහනම් කළ නිළධාරියාට ගෙවන ලද වැටුප් අයකර ගැනීම සඳහා DMR 1029/2014 දරණ මුදල් අය කර ගැනීමේ ( Money Recovery Matter) නඩුව කොළඹ දිසා අධිකරණයේ පවරා ඇති අතර මේ වන විට එය විභාග වෙමින් පවතී.

තව ද මේ සම්බන්ධව දැනට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මඟින් ද පරීක්ෂණ සිදු කරමින් පවතී. මෙම නිළධාරියාට වැටුප් වශයෙන් රු.1,711,961/= ක මුදලක් ගෙවා ඇති බව පිළිගනිමි. මෙම මුදල් අය කර ගැනීම සඳහා දිසා අධිකරණයේ මෙම නිළධාරියාට විරුද්ධව නඩුවක් පවරා මේ වන විට විභාග වෙමින් පවතී.

4.4(අ) ධාවනය සඳහා යොදාගනී.

4.4(ආ) මෙම උපකරණ ලෝහ වැඩ ක්ෂේත්‍රයට අදාල වන බැවින් පැස්සුම් අංශයේ ආධුනිකයන් හට අමතර දැනුමක් ලබාගැනීම සඳහා මෙන්ම වෙනත් විශේෂ වැඩසටහන් සඳහාද යොදාගනු ලබන බැවින් අංශය තුල තවදුරටත් තබා ඇත.

4.4(ඇ) මේ වන විට අදාල උපකරණ භාවිතා කරමින් මෙම පාඨමාලාව සාර්ථකව පවත්වාගෙන යනු ලබයි.

4.5(අ) ගිණුම් අංක 165199 ගිණුම වසා දැමීමට කටයුතු කර ඇත. ඉතිරි ගිණුම් 04 වර්ථමානයේදී සක්‍රීයව පවතී.

4.5(ආ) පාඨමාලා ප්‍රතීතනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලට ගැනීමට මෙම අරමුදල ලැබී ඇති අතර මේ වන විට පාඨමාලා විශාල ප්‍රමාණයක් ප්‍රතීතනය කර ඇත. ඒ අනුව මෙම අරමුදල් භාණ්ඩාගාර ප්‍රතිපාදන අරමුදලට මාරු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

4.6 පහත සඳහන් නිලධාරීන් තිදෙනා රේඛීය අමාත්‍යාංශයට නිදහස් කර තිබිණි.

1. P.B.G.I.B.වැගන්තලේ මහතා
2. R.D.S.J.කුමාර මහතා
3. P.ප්‍රමිලා මෙය

ඊට අමතරව ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන සඳහා රියදුරු R.විමලනාදන් මහතා වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත නිදහස් කර ඇති අතර, 2016 වර්ෂය තුළ වැටුප් ලෙස ගෙවන ලද සම්පූර්ණ මුදල මෙම අධිකාරියට ප්‍රතිපූර්ණය කර ඇත.

අමාත්‍යාංශයේ වාහන සංචිතයේ වාහන වල අඩුවක් තිබූ බැවින් අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා තවකාලික වාහන ලබා දෙන ලෙස ලිඛිතව ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ සංචිතයට වාහන ගන්නා තෙක් අමාත්‍යාංශයට මෙම වාහන නිදහස් කර ඇත. අමාත්‍යාංශයේ වාහන සංචිතයට වාහන ලැබුණු පසු මෙම වාහන ප්‍රයෝජනය සඳහා ලබා ගැනීමට කටයුතු කරමි.

4.7(අ) 2018 වර්ෂයේදී අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කිරීමට සැළසුම් කර ඇත.

4.7(ආ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම අධිකාරියට අයත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තුළ අළුතින් ඉදිකිරීමට නියමිත සියළුම ගොඩනැගිලි 2016.12.31 දින වන තෙක් ඉදිකර අවසන් වීනොමැත. එබැවින්, එම මධ්‍යස්ථාවල ආරම්භ කිරීමට සැලැසුම් කරන ලද පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වී ඇත. දැනට වැඩ කටයුතු අවසන් කර ඇති මධ්‍යස්ථානවල පමණක් පාඨමාලා ආරම්භ කර ඇත. එමෙන්ම වාර්ෂික පුහුණු සැලැසුමට අනුව නියමිත උපදේශකවරුන් බඳවා ගැනීමට කටයුතු කිරීමේදී රැකියා වෙළඳපොළ තුළින් අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් එම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කාර්යය මණ්ඩලය අනුමත කිරීමේදී තනතුර දරන්නාට පුද්ගලික වන සේ අනුමත කරන ලද ද්විතීයික මට්ටමේ තනතුරුවල සිටි නිළධාරීන්ට ඔවුන්ගේ සුදුසුකම් මත ද්විතීයික මට්ටමේ පුරප්පාඩු පැවති තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර ඇති අතර ප්‍රාථමික මට්ටමේ පුදගලිකවන සේ අනුමත කර ඇති නිලධාරීන් සේවයෙන් විශ්‍රාම යාමෙන් සහ ඉවත් වීම යන කරුණු මත ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල පුද්ගලික වනසේ අනුමත තනතුරුවල නිත්‍ය තනතුරු සංඛ්‍යාව අඩුවී ඇත.

4.7(ඇ) මෙරට තුළ ප්‍රථම වරට ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) 2007 වර්ෂයේදී ආරම්භ කරන ලදි. එම ක්‍රමය යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් 05 වන මට්ටම 2012 වර්ෂයේ සිට සීමිත පාඨමාලා කිහිපයක් සඳහා ක්‍රියාත්මක කර ඇත. ඉන්පසු වර්ෂවල වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට අයදුම්පත් කැඳවීම් සිදු කරන ලදි. එහෙත් රැකියා වෙළඳ පොළ තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් 05 වන මට්ටම සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හේතුවෙන් එම උපදේශක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට නොහැකිවීමේ දුෂ්කරතාවයකට මුහුණු දීමට සිදුවී ඇත. එබැවින්, පාඨමාලා පවත්වා ගෙන යාමේ සේවා අවශ්‍යතාවය මත ජාතික වෘත්තීය සුදුසුකම් 04 වන මට්ටම හෝ ඊට සමාන සුදුසුකම් සහිත වසරක සේවා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

මෙම අධිකාරියේ බඳවා ගැනීම් පටිපාටිය 2014.03.18 දින අනුමත කර ඇත. එම බඳවා ගැනීම් පටිපාටියට අනුව උපදේශක තනතුර කළමනාකාර සහකාර තාක්ෂණ (MA1-2) සේවා ගණය යටතේ අනුමතකර ඇති අතර, බඳවා ගැනීමේ සුදුසුකම ජාතික වෘත්තීය සුදුසුකම් 05 වන මට්ටම ලබා දී ඇත. බඳවා ගැනීම් පටිපාටිය අනුමත කරන ලද දිනට පෙර එවකට පැවති සුදුසුකම් යටතේ බඳවා ගත් උපදේශක තනතුරේ සිටි නිලධාරීන් ඔවුන්ට පුද්ගලික වන සේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන (MA1-2) සේවා ගණයේ ස්ථිර කාර්ය මණ්ඩලය යටතේ අනුමතකර ඇත. එබැවින් ඒ

යටතේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටි උපදේශකවරුන් එවකට බඳවාගත් සුදුසුකම් මත වසර 03 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ස්ථිර කිරීමට කටයුතු කර ඇත.

4.7(ඇ) අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර සඳහා 2015.02.22 දින සිට පුරප්පාඩුවී පැවති අතර ඒ සඳහා ඒ වන විට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර 10 ක සේවා පළපුරුද්දක් තිබූ අභ්‍යන්තර වශයෙන් එම තනතුරට සුදුසුකම් ලබා තිබූ ඩබ්.ඒ. රණවීර මහතා වැඩ බැලීම සඳහා පත්කරන ලදී. ඉන්පසු ඔහුගේ කාර්යක්ෂමතාවය හා පෙර අධිකාරිය තුළ දරණ ලද පහත සඳහන් තනතුරු සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඩබ්.ඒ. රණවීර මහතාගේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර ස්ථිර කරන ලදී.

ඩබ්.ඒ. රණවීර මහතා විසින් පෙර දරණ ලද තනතුරු

| තනතුර | සේවා කාලය |
|---|---|
| අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියා ස්ථාපන) වැ.බ. | 2006.10.02 - 2008.02.25 |
| අධ්‍යක්ෂ ජනරාල් (වැ.ආ) | 2008.02.25 - 2008.04.15 |
| අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) | 2008.04.15 - 2010.12.10 |
| අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියා ස්ථාපන) වැ.බ. | 2012.11.05 - 2014.06.17 |
| අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) | 2015.04.24 දින සිට මේ දක්වා |

මෙම පත්කිරීම වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 16.(1) වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇති බලතල අනුව පත්කර ඇත.

4.7(ඉ) විධිමත් ලෙස ස්ථාන මාරු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

උපදේශකවරුන් ඇතුළු අධිකාරියේ කාර්යය මණ්ඩලය සඳහා මේ වන විට විධිමත් මාරු වීම් ක්‍රියා පටිපාටියක් ඇත. වාර්ෂික මාරු කිරීම් වලට අමතරව ස්ථාන මාරු කිරීමට සිදු වන්නේ පාඨමාලා මාරු කිරීම, එනම් සේවා අවශ්‍යතාව පදනම් කරගෙන වේ.

4.7(ඊ) මෙම නිළධාරිනිය බඳවාගෙන ඇත්තේ 2011 ජූනි 09 දින මාධ්‍ය උපදේශිකාවක් වශයෙනි. ඇයට පැවරී තිබූ රාජකාරිය වන්නේ ඉගැන්වීම් කටයුතු නොව මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරමින් වෘත්තීය පුහුණු අධිකාරිය පිළිබඳව මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා ගැනීමය. එම රාජකාරිය මෙම නිළධාරිනිය සාර්ථකව ඉටුකර ඇත. වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශකවරුන්ට තමන්ගේ විෂය ක්ෂේත්‍රය මාරු කිරීමට අවස්ථාවක් ලබා දෙන අතර ඒ තුළින් මෙම උපදේශිකාවද මාධ්‍ය ක්ෂේත්‍රයේ සිට පරිගණක ක්ෂේත්‍රය දක්වා විෂය ක්ෂේත්‍රය මාරු කරගෙන ඇත. ඒ සඳහා මෙම උපදේශිකාව NVQ 03 සහතිකයක් RPL යටතේ ලබාගෙන ඇත. ක්ෂේත්‍රය මාරු කර ගත් පසු මෙම උපදේශිකාව නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ IT නොවන පාඨමාලා සඳහා IT විෂය ඉගැන්වීමේ කටයුතු කර ඇත.

මෙම නිළධාරිනිය නව බඳවා ගැනීම් පටිපාටිය අනුමත කිරීමට පෙර බඳවා ගන්නා ලද නිලධාරිනියක් වේ. එබැවින් එම නිලධාරිනිය අයත් උපදේශක තනතුර නව බඳවා ගැනීම් පටිපාටිය අනුමත කිරීමේදි කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන (MA 1-2) සේවා ගණය යටතේ, තනතුර දරන්නාට පුද්ගලික වන සේ අනුමත කර ඇත. එබැවින් එම නිලධාරිනිය එම සේවා ගණය යටතේ කොන්ත්‍රාත් උපදේශකවරුන් ස්ථිර කිරීමට කටයුතු කිරීමේදී එවකට බඳවා ගත් සුදුසුකම් මත වසර 3 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු සේවයේ ස්ථිර කිරීමට කටයුතු කර ඇත.

මෙම නිළධාරිනිය වැල්ලවත්ත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට මාරු කිරීමට අධ්‍යක්ෂ (පුහුණු) ඉල්ලීම් කළද වැල්ලවත්ත මධ්‍යස්ථානයේ NVQ LEVEL 4 පරිගණක පාඨමාලාවක් පවතින බැවින් එම ස්ථාන මාරුවීම සිදු නොකරන ලදී.

අධිකාරියේ ප්‍රවර්ධන කටයුතු විධිමත් සහ වේගවත් කිරීම සඳහා මාධ්‍ය ඒකකය අවශ්‍යතාවය දීර්ඝ කාලයක සිට පැවති බැවින් මාධ්‍ය ඒකකය ස්ථාපිත කර මෙම නිළධාරිනිය එයට අනුයුක්ත කරන ලදී. මෙම නිළධාරිනියගේ මාධ්‍ය සම්බන්ධව ඇති දීර්ඝ කාලීන අත්දැකීම සහ පළපුරුද්ද මෙම ඒකකයේ කාර්යක්ෂමතාවයට බෙහෙවින් ඉවහල් වී ඇත. එසේම අනිකුත් නිළධාරීන් ද මාධ්‍ය කටයුතු පිළිබඳව අත්දැකීමක් හා හැකියාවක් ඇති බැවින් එම ඒකකය සඳහා අනුයුක්ත කර ඇත. මෙම ඒකකය පිහිටුවීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද අනුමත කොට ඇත. කෙසේ වෙතත් මෙම ඒකකය ක්‍රියාත්මක වන්නේ වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියා ගත කිරීම් අංශය යටතේ උප ඒකකයක් ලෙසය.

4.8 SSDP ව්‍යාපෘතිය යටතේ 2014 සහ 2015 යන වසරවල නවීකරණයට යෝජිත වූ මධ්‍යස්ථාන 50න් මධ්‍යස්ථාන 43 ක නවීකරණ කටයුතු ආරම්භ කරන ලෙස දෙන ලද උපදෙස් අනුව ඒ සඳහා සැලසුම් හා ප්‍රමාණ බිල්පත්‍ර සකස් කිරීමට, තෝරාගත් උපදේශක ආයතනය වෙත භාරදෙන ලදී. ඉන් අනතුරුව SSDP ව්‍යාපෘතිය මඟින් මෙම සංඛ්‍යාවද 31 දක්වා අඩු කරන ලදුව ඒ සඳහා සැලසුම් ද ඉන් 28ක් සඳහා ප්‍රමාණ බිල් පත්‍ර ද සකස් කරවා ගන්නා ලදී. මේ සඳහා එම උපදේශක ආයතනයට ගෙවීම් කරන ලදී. ඉහත දක්වන ලද මධ්‍යස්ථාන 09 ද මේ අනුව නවීකරණය සඳහා සැලසුම් කරන ලදී. මේවා අතරින් නුවරඑළිය, බුල්නෑව යන මධ්‍යස්ථාන 2016 වසරේ ප්‍රසම්පාදන කටයුතු කර නවීකරන කටයුතු ආරම්භ කර ඇත. ගොඩකවෙල හා වේයන්ගොඩ මධ්‍යස්ථාන වල නවීකරණ කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු නිමකර කොන්ත්‍රාත්තු ප්‍රදානය කර ඇත. ඉතිරි මධ්‍යස්ථාන නවීකරණ කටයුතු ද ව්‍යාපෘතියෙන් මුදල් ලැබෙන පරිදි ඉදිරියේදී ආරම්භ කෙරෙනු ඇත.

5.1 අපේක්ෂිත අරමුණු ඉටුවන ලෙස කටයුතු සිදු කරමින් පවතී.

5.2(අ) තෙවන පාර්ශවය සඳහා අදාල රක්ෂණ වන්දි මුදල් අපගේ රක්ෂණ සමාගමෙන් ලබාගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

5.2(ආ) ඒ අනුව 2017 වසරේ ගිණුම් වලට ගැලපීම් කිරීමට කටයුතු යොදා ඇත.

5.2(ඇ) මෙම නිළධාරියා පත්කොට ඇත්තේ අතිගරු ජනාධිපතිතුමන්ගේ නියමය පරිදි ජනාධිපති ලේකම් විසිනි.

ඔහුව සතියකට වරු 03ක් නිදහස් කොට ඇත්තේ සභාපතිතුමන්ගේ අනුමැතියෙනි. වෘත්තීය පුහුණු අධිකාරියේ පණතට අනුව සභාපතිවරයා ප්‍රධාන විධායක නිළධාරියා වන බැවින් මෙම නිදහස් කිරීම කර ඇති අතර ඔහු මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලය මඟින් අනුමත කොට ඇති දීමනාවක් ලබාගෙන ඇත.

මේ සම්බන්ධව මධ්‍යම සංස්කෘතික අරමුදල කැඳවා තිබූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් වෙත නියම කර ඇත්තේ මෙම නිළධාරියාට ගෙවන ලද දීමනාව මහාභාණ්ඩාගාරය මඟින් අනුමත කරගන්නා ලෙස. එසේම මෙම නිළධාරියා මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවය කරන බවට ප්‍රකාශ කර ඇත්තේ පූර්ණ කාලීනව නොව සතියට වරු 03ක් පමණි.

උක්ත කාරණය සම්බන්ධව ජනාධිපති ලේකම්ගෙන් විමසා උපදෙස් ලබා ගැනීම සඳහා ලිපි යොමුකර ඇති අතර මේ වන තුරු ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත.

5.2(ඇ) (i) අධ්‍යක්ෂ ජනරාල් තනතුර

වෘත්තීය පුහුණු අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා තිබිය යුතු බව සඳහන් වී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම.සමඟ ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සහ උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර විස්සක (20) ක පළපුරුද්ද. (අවම වශයෙන් මින් වසර 5 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.)

ඒ අනුව මේ වන විට බඳවා ගෙන ඇති නිලධාරිනිය 1990 වසරේ රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාවේදී විශේෂ උපාධිය ( B.Sc Agriculture (Special ) සහ 1995 වසරේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය (Msc) ලබා ඇත.

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු 1991 සිට 2014 දක්වා අධ්‍යයන සහ තාක්ෂණික ආයතන වල කළමණාකරණ සේවා ගණයේ සහ ඊට ඉහළ විවිධ තනතුරු දරා ඇති අතර එම කාලය තුළ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, විවෘත විශ්ව විද්‍යාලය, හාඩි උසස් තාක්ෂණ ආයතනය අම්පාර, ටච්වුඩ් පෞද්ගලික ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටමේ තනතුරු වසර 8 කට වැඩි කාලයක් හොබවා ඇත.

ලකුණු ලබා දීමේ ක්‍රමවේදයේදී අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් ලෙස පිළිගත් වෘත්තීය ආයතනයක (Professional Institute) සම්පූර්ණ සාමාජිකත්වය (Membership) හෝ වරලත් (Charted) සුදුසුකම සලකනු ලබන අතර මෙම නිලධාරිනිය ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනයේ (Institute of Biology Sri lanka) සම්පූර්ණ සාමාජිකත්වය මෙන්ම වරලත් (Charted) සුදුසුකමද ලබා ඇත.

මේ අනුව බඳවා ගෙන ඇති නිලධාරිනිය, බඳවා ගැනීමේ පරිපාටියට අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අදාල සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇත. තවද විවෘත පුවත්පත් දැන්වීමක් පළ කර අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ස්වාධීන, පරිණත, පළපුරුදු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සම්මුඛ පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අදාළ තනතුරට බඳවාගෙන ඇත.

(ii) අධ්‍යක්ෂ (පුහුණු)

මෙම අධ්‍යක්ෂ (පුහුණු) තනතුරේ සිටි නිළධාරියා පෙර පැවති කළමණාකාරීත්වයේ තීරණයක් මත පත්කර ඇති අතර මේ වන විට අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

(iii) අධ්‍යක්ෂ (සැළසුම් පර්යේෂණ හා සංවර්ධන)

අධ්‍යක්ෂ (සැළසුම් පර්යේෂණ හා සංවර්ධන) තනතුරේ සිටින නිළධාරිනිය වෘත්තීය පුහුණු අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව අදාල සුදුසුකම් සම්පූර්ණ කර ඇත. අදාල තනතුර සඳහා ඉල්ලුම්කරු විසින් ලබාගෙන ඇති අධ්‍යාපනය හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තරයක් පෞද්ගලික ලිපිගොණුව වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 1995 වසරේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් රසායන විද්‍යාව විශේෂවේදී (B.Sc Chemistry ) ගෞරව උපාධියක් ලබා ගෙන ඇත. 2002 වසරේ දී University of London වලින් ආචාර්ය උපාධියක් (PhD) ලබා ගෙන ඇත ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු කාර්මික තාක්ෂණ ආයතනයේ ඉහළ කළමණාකරණ මට්ටමේ තනතුරක අවුරුදු 05 මාස 07 ක කාලයක් සේවය කිරීම. ඊට අමතරව ඇමරිකා එක්සත් ජනපදයේ Post-Doctoral Research Fellow ලෙසද වසර 04 ක් කටයුතු කර ඇත. මෙය කළමණාකාර සේවා ගණයේ වෘත්තීය සුදුසුකමක් වන අතර අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකමක් ද වේ.

කළමණාකරණ සේවා දෙපාර්තුමෙන්තුව විසින් හදුන්වා දෙන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව ජ්‍යෙෂ්ඨ විධායක ( HM 1-1 ) ගණයට ආචාර්ය උපාධිය සුදුසුකමක් ලෙස සඳහන් කර නොමැති වුවද

අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ආචාර්ය උපාධිය සුදුසුකමක් ලෙස වසර 5 ක ඉහළ කළමණාකරණ මට්ටමේ පළපුරුද්දක් සමග සඳහන් කර ඇත

ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පහළ තනතුරක් වන අධ්‍යක්ෂ තනතුර සඳහා ආචාර්ය උපාධියක් හා පස් වසරකට වැඩි පර්යේෂණ සහ සැළසුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ප්‍රමාණවත් ලෙස උක්ත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත

ශ්‍රී ලංකාවේ ‘‘කළමණාකාරිත්වය’’ සම්මත ක්‍රමවේදයකින් අර්ථ නිරූපනය කර නොමැත. එමනිසා ඒ ඒ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් මණ්ඩලයට ඉහළ කළමණාකාරිත්වයට අදාළ සේවා පළපුරුද්ද තීරණය වෙයි. එමනිසා පරිණත සහ පළපුරුදු සහිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලබා දී ඇති එම ලකුණු සම්බන්ධව කිසිවක් ප්‍රකාශ කළ නොහැක.

(iv) අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියා ගතකිරීම් හා ප්‍රවර්ධන)

අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියා ගතකිරීම් හා ප්‍රවර්ධන) තනතුර සඳහා බඳවා ගැනීමේදී වෘත්තීය පුහුණු අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇත. අදාළ තනතුර සඳහා ඉල්ලුම්කරු විසින් ලබාගෙන ඇති අධ්‍යාපනය හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තරයක් පෞද්ගලික ලිපිගොනුව වෙත ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ ‘‘කළමණාකාරිත්වය’’ යන්න සම්මත ක්‍රමවේදයකින් අර්ථ නිරූපනය කර නොමැත. එමනිසා ඒ ඒ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් මණ්ඩලයට ඉහළ කළමණාකාරීත්වයට අදාළ සේවා පළපුරුද්ද තීරණය වේ. එමනිසා පරිණත, පළපුරුදු සහ ස්වාධීන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ලබා දී ඇති එම ලකුණු සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැක.

තවද මෙම නිළධාරීන් බඳවාගැනීමේදී විවෘත පුවත්පත් දැන්වීමක් පළ කර අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ස්වාධීන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සම්මුඛ පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව අදාළ තනතුරු වලට බඳවාගෙන ඇත.

(v) නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු

අප ආයතනය විසින් සුදුසුකම් නොමැතිව නියෝජ්‍ය අධ්‍යක්ෂ දෙදෙනෙකු පත් කර නොමැත. සියළු නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් පත් කොට ඇත්තේ MM-1-1 සේවා ගණයේ වසර 10 සේවා කාලයක් සැපිරීමෙන් අනතුරුව සහ කාර්යක්ෂමතා කඩඉම සමත් වීමෙන් අනතුරුවයි.

(v) සහකාර අධ්‍යක්ෂ තනතුරු

විගණනය විසින් වාචිකව ප්‍රකාශ කළ පරිදි සහකාර අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු වන ඉනෝකා ගුණවර්ධන නැමැති නිළධාරිනිය පෙර පැවති කළමණාකාරීත්වයේ තීරණයක් මත සහකාර අධ්‍යක්ෂ සම්බන්ධීකාරක තනතුර සඳහා පත්කර ඇත. මේ වන විට එම නිළධාරිනිය පුහුණු අංශයේ සේවයේ යොදවා ඇති අතර තනතුරු නාමයද වෙනස් කිරීමට කටයුතු කරමින් පවතී. විගණනය විසින් වාචිකව ප්‍රකාශකළ පරිදි අනෙක් සහකාර අධ්‍යක්ෂවරයා වන එච්.එදිරිසිංහ මහත්මිය සහකාර අධ්‍යක්ෂ (මුදල්) ලෙස බඳවා ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇත.

(vi) නීති නිළධාරී තනතුර

මෙම නීති නිළධාරී තනතුර දරණ නිළධාරිනිය 2013.09.16 වන දින අධිකාරියේ සේවයට වාර්තා කර ඇත. ඇය 2011.12.13 වන දින ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥවරියක් වශයෙන් දිවුරුම් දී ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී (ගෞරව) උපාධියක් ලබාගෙන ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥවරියක් වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව 2011.12.13 සිට 2012.05.21 දක්වා, ජ්‍යෙෂ්ඨ නීතීඥවරයෙකු යටතේ කනිෂ්ඨ නීතීඥවරියක ලෙස සේවය කර ඇති අතර, 2012.05.22 සිට 2013.09.03 දින දක්වා පෞද්ගලික මූල්‍ය ආයතනයක නීති නිළධාරිනිය ලෙස සේවය කර ඇත. බඳවා ගැනීමේ පටිපාටියට අනුව නීති නිළධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් වන්නේ, නීතිවේදී උපාධිය සමඟ ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥවරියක වශයෙන් දිවුරුම් දී වසරක (1) සේවා පළපුරුද්දක් ලබා තිබීමයි.

ඒ අනුව, මෙම නීති නිළධාරිනිය අධිකාරියේ සේවයට වාර්තා කරන විට ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥවරියක ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව අවුරුදු 1කුත් මාස 9ක කාලයක් සම්පූර්ණ කර සිටි හෙයින් බඳවා ගැනීමේ පටිපාටියේ දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කර ඇත.

(vii) සහකාර අධ්‍යක්ෂ (මුදල්)

අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා අනුමත කාර්ය මණ්ඩලයට පිටතින් බඳවාගෙන නැත. මුදල් අංශය සඳහා සහකාර අධ්‍යක්ෂ තනතුරු 05ක් අනුමත වී ඇත.

6. මේ වන විට බඳවා ගැනීම් නිසි ක්‍රමවේදයන්ට අනුව සිදුකරමින් පවතී. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ විධිමත්ව ක්‍රියාත්මක කිරීමටත් ස්ථාන මාරු ක්‍රමය විධිමත්ව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු සිදු කරනු ඇත.

6(ආ) නව මෘදුකාංග පද්ධතියට දත්ත ඇතුලත් කරමින් පවතී.

6(ඇ) * ඒ අනුව නිවැරදි කර ඇත.

* ඒ අනුව නිවැරදි කර ඇත.

6(ඈ) ඒ අනුව නිවැරදි කර ඇත.